
# නියමුවා

“විප්ලවය යනු ඓතිහාසික අවශ්‍යතාවයක
පැන නැගීමක් මිස හිතුවක්කාරකමක
හෝ පුද්ගල කැමැත්තක ප්‍රතිඵලයක්
නොවේ. කිසිවෙකුට විප්ලවය වැළැක්වීමට
නොහැකිවාක් මෙන්ම විප්ලවය බලෙන් පැටවිය
නොහැකිද වන්නේය. විප්ලවය වනාහී අති
මහත් අවශ්‍යතාවයක පැන නැගීමකි”

**ෆිදෙල් කස්ත්‍රෝ**

ISSN 1391 - 1031 | 2021 අප්‍රේල්, 26 වෙළුම 04 කලාපය | ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත | පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී | ආධාරය රු 40/=

## 71’ උදාගිර



කොවුලාන
වසන්තයේ
ගීතය ගැයූ
මානව ප්‍රේමයේ

නුඹලා නිදන
මේ මහ පොළොව
නපුරු හීනයක
අඳුරුම පැයක

මේ ශුෂ්ක බිම් අතර
අපට මහ කඳු සිරස
අතීතෙන් හමා එන
ප්‍රාණ වායුව නුඹය

ඒ උදා වසන්තේ
අදිරදේ මඟුල් ගී
රදළ සාද ද නැවතී
පවුරු දෙදරා වැටුණේ

මමත්වය පෙරටු
කරගෙන
ගලා යන දිවිය ළඟ
මරණයේ කෙඳිරිලිම
අඳෝනාවක ඇසෙන

සුවහසක් තාරකා
පාවෙනා අහස යට
දස දහක් තාරකා
පොළෝ ගැබ පිපී ඇත

ඒ තාරකා ඇසින්
වටු රැලක් සේ නැගී
නව ලොවක අරුණැල්ල
අඳුර විනි විදිනු ඇත

පුරා අඩ සියවසක
අලුත් ඉර උදාවට
මග හසර කියාදෙන
ඒ උදාගිර නුඹය...

# සදා සමරමු සොහොයුරෝ!

## 1971 - 2021



# ආණ්ඩුව අවුරුද්දට වස කවයි

ජනතාව විසින් පරිභෝජනය කරනු ලබන අත්‍යාවශ්‍ය ආහාර ගෙන්වීමේදී හා බෙදා හැරීමේදී, ජාවාරම්කාරී සමාගම්වල අධික ලාභ ලැබීමේ වුවමනාව හා කොමිස් කුට්ටි ගැනීමේ වුවමනාව වෙනුවෙන් ආණ්ඩුව ජනතාවට වස කවන තත්වයක් ඇති වී තිබේ.

විශේෂයෙන් එළඹෙන සිංහල සහ හින්දු අලුත් අවුරුද්ද වෙනුවෙන් පසුගිය කාලයේ බදු සහන යටතේ සමාගම් ගණනාවක් විසින් ආනයන කරන ලද පොල්තෙල් තොගවල මිනිස් ශරීරයට අහිතකර අෆ්ලාටොක්සීන් නම් පිළිකාකාරක විෂ රසායනය අඩංගු බවට මේ වන විට සොයා ගෙන ඇත.

මෙම තෙල් තොගයන්හි සාම්පල් පරීක්ෂාවෙන් පසු ඒවා විෂ රහිත බවට ප්‍රමිති ආයතනයෙන් සහතික ලැබුණු බැවින් ඒවා අදාළ සමාගම්වල ගුදම්වලට මුදා හැරි බව රේගු ආරංචි මාර්ග සඳහන් කර තිබිණි. මෙම මතභේදාත්මක තීරණ ලබා දුන් තාක්ෂණ අමාත්‍ය ධුරය දරන ගෝඨාභය රාජපක්ෂ මහතා යටතේ පවතින ප්‍රමිති ආයතනයේ ප්‍රධානියාව සිටින්නේ පසුගිය කාලයේ සතොස ආයතනයට සීනි මිලදී ගැනීමේදී වංචා කළ බවට චෝදනා ලැබීම හමුවේ එයින් ඉවත් කරන ලද පුද්ගලයකි.

මෙය ජාවාරම්කාරී සමාගම් විසින් බදු වංචාවලින් ලාභ ලැබීමට අමතරව පාරිභෝගික ජනතාව රෝගීන් බවට පත්කිරීමට සැලැස්වීමක්ද වන අතර මෙම සිදුවීම, රටේ පවතින ජාවාරම්කාරී ආර්ථිකයේ ස්වභාවය පමණක් නොව ඒ හා බැඳුණු ජරාජීර්ණ දේශපාලනයත් විශේෂයෙන්ම ජනතාව සම්බන්ධයෙන් ආණ්ඩුවේ වගකීම් විරහිතභාවයත් ප්‍රදර්ශනය කරනු ලබන බව විචාරකයෝ පෙන්වා දෙති.

ආහාරවලට විෂ මිශ්‍ර කිරීම මෙන්ම වස සහිත ආහාර ගෙන්වීම හා බෙදාහැරීමද අපරාධයකි. එම අපරාධය පිටුපස දැන් සිටින්නේත් අපරාධකාරී ජාවාරමුන් රකින්නේත් ආණ්ඩුවය; එහි බලධාරීන්ය. එපමණක් නොව රටේ වන සම්පත විකිණීම පිටුපස සිටින්නේත් පරිසරය රැකීමට උත්සාහ කරන නිලධාරීන්ට එරෙහිව අවි අමෝරා සිටින්නේත් නීතිවිරෝධී මත්පැන් පෙරීම ස්වයං රැකියාවක් කිරීමට ඉල්ලන්නේත් ආණ්ඩුවේ දේශපාලකයින්ය. ඉන් කියවෙන්නේ මේ ක්‍රමය තුළ ආණ්ඩුවේ බලධාරීන් අපරාධකරුවන් රකින්නන් හා අපරාධකරුවන් වී ඇති බවය. පවතින තත්වය වෙනස් කිරීම සඳහා ජනතාව වහාම ක්‍රියාත්මක විය යුතුව ඇති බව මෙම සියලු කරුණුවලින් ඉතාම පැහැදිලිය.

03 ධනවාදයේ අර්බුදය...



දැනටමත් වැළැක්විය නොහැකි ලෙස ගෝඨාභයට විවිධ හේතු මත ඡන්දය දුන් සිංහල බෞද්ධ ඡන්ද රැසක් අහිමි වෙමින් තිබෙන හා ඒවා යළි රැකගත නොහැකි...

05 සමාජ ආර්ථික...





විදේශීය වෙළඳපොළෙන් ණය ගන්න වෙනවා. ඒ වෙනුවෙන් කරන්න සිදුවෙලා තිබෙන්නේ රටේ සම්පත් විකිණීමයි...

07 ඩොලර් අර්බුදය...



ජනතාව තවත් පීඩාවට පත්කරන ණය කොන්දේසි තොගයක් වෙනුවෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ණය උගුලකට රට හිර කිරීම හැර...

09 නරුම සමාජයක් මැවූ ධනවාදය...



පානීය ජලය බෝතල් කොට විකුණන මේ ක්‍රමයම හෙට දිනයේ මිනිසුන්ට හුස්ම ගැනීමට ඔක්සිජන්ද බෝතල් කර විකුණනු ඇත...

තරුණ........ 04
ජාත්‍යන්තර........ 06
කාන්තා........ 08
විශේෂ........ 10

***යුක්තිගරුක දේශයක්! සාධාරණ සමාජයක්!! නිවහල් මිනිසෙක්!!!***

# සටන් බිම

## දේශපාලන පත්වීම්වලට එරෙහිව ගුරු-විදුහල්පති විරෝධතා උද්ඝෝෂණ




ආණ්ඩුව විදුහල්පති හා අධ්‍යාපන පරිපාලන සේවාවල දැනට පවතින පුරප්පාඩු 5000ක් සඳහා සිදු කිරීමට යන දේශපාලන පත්වීම් හකුළා ගැනීමට බලකරමින් ගුරු විදුහල්පති, අධ්‍යාපන පරිපාලන, ගුරු අධ්‍යාපනඥ ඒකාබද්ධ උද්ඝෝෂණයක් පසුගියදා පැලවත්ත අධ්‍යාපන අමාත්‍යාංශය ඉදිරිපිටදී පවත්වනු ලැබිණි. අධ්‍යාපනය සුරැකීමේ වෘත්තීය සමිති එකමුතුව නමින් පැවැත් වූ මෙම විරෝධතාවය පැලවත්ත බුද්ධදාස ක්‍රීඩාපිටිය අසලින් ආරම්භ කෙරුණු අතර අධ්‍යාපන අමාත්‍යාංශය තෙක් වූ පාගමනකින් පසු උද්ඝෝෂණය සිදු විය. මෙහිදී පොලිසියේ පහරදීම් හා බාධාකිරීම් සිදු වූ අතර අමාත්‍යාංශයෙන් කිසිදු සාකච්ඡාවක් ගුරු විදුහල්පතිවරුන් වෙත ලබා දී තිබුණේ නැත.

මෙහිදී ගුරු විදුහල්පතිවරුන් ඇමතූ ලංකා ගුරුසේවා සංගමයේ ලේකම් මහින්ද ජයසිංහ සහෝදරයා සඳහන් කළේ පසුගිය ආණ්ඩුවද මෙලෙස දේශපාලන පත්වීම් සිදු කිරීමට උත්සාහ කළ බවත් එය පරාජය කිරීමට ගුරු විදුහල්පතිවරුන් පෙරමුණ ගත්තාසේම මෙම ආණ්ඩුව සිදුකරමින් යන දේශපාලන පත්වීම් පරාජය කිරීම සඳහා ඉදිරියේදී රට පුරා දැවැන්ත ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බවයි. මෙම විරෝධතා උද්ඝෝෂණය සඳහා ලංකා ගුරු සංගමයේ ලේකම් ජෝසප් ස්ටාලින්, සමස්ත ලංකා එක්සත් ගුරු සංගමයේ ලේකම් යල්වෙල පඤ්ඤාසේකර හිමි, අධ්‍යාපන පරිපාලන සේවා සංගමයේ ප්‍රධාන ලේකම් නීල් අතුකෝරල ඇතුළු වෘත්තීය සමිති නියෝජිතයෝ රැසක් සහභාගි වූහ.

## ඉන්දියානු ගොවිජන අරගලයට ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ සහාය




ඉන්දීය ගොවි ජනතාව අපහසුතාවයට සහ අගාධයට ඇද දමමින් ඉන්දියානු මෝදි අගමැතිගේ නීති පැනවීමත්, ගජමිතුරු අදානි වැනි ව්‍යාපාරිකයන්ට ගොවි ජනතාව කොල්ලකෑම සඳහා ඉඩ සැලසීමත් හේතුවෙන් ඉන්දියාව පුරා පැන නැගී ඇති ගොවි ජනතාවගේ සටනට සහයෝගය පළකරමින් ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානය විසින් පසුගිය 18වැනි දින දෙහිවල, ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථාන රැස්වීම් ශාලාවේදී සම්මන්ත්‍රණයක් පැවැත්විය.

මෙම සම්මන්ත්‍රණය සඳහා ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන මණ්ඩල සභික බිමල් රත්නායක සහෝදරයා, සමස්ත ලංකා ගොවිජන සම්මේලනයේ කැඳවුම්කරු නාමල් කරුණාරත්න සහෝදරයා සහ අන්තර් සමාගම් සේවක සංගමයේ ප්‍රධාන ලේකම් නීතිඥ ජානක අධිකාරි සහෝදරයා ඇතුළු වෘත්තීය සමිති නියෝජිතයෝ සහභාගි වී සිටියහ.

## හෝටල් සේවකයින්ගේ ප්‍රශ්න නොවිසඳීමට එරෙහිව උද්ඝෝෂණ



ලක්‍ෂ එකහමාරක් වන හෝටල් සේවකයින් මුහුණ දෙන අර්බුදය සඳහා ආණ්ඩුව විසින් පිළියම් නොදීමට එරෙහිව හෝටල් සේවකයෝ විරෝධතා ක්‍රියාමාර්ගවලට එළඹීමට කටයුතු කරන බව හෝටල් සේවක මධ්‍යස්ථානයේ සභාපති නීතිඥ ජානක අධිකාරි සහෝදරයා පවසයි. ඒ අනුව පසුග ිය මාර්තු 24 අලුත්ගමදීත්, මාර්තු 30 මාතරදීත්, උද්ඝෝෂණ පැවැත්වුණු අතර අප්‍රේල් 01 කොළඹදී හා අප්‍රේල් 07 ගාල්ලේදී මෙම විරෝධතා උද්ඝෝෂණ ක්‍රියාමාර්ග සිදුකරන බව ජානක අධිකාරී සහෝදරයා නියමුවා වෙත පැවසීය.

ආණ්ඩුව ගජමිතුරන්ට රුපියල් කෝටි 1500 සීනි සහන දෙද්දී අර්බුදයට මුහුණදී සිටින 150,000ක් හෝටල් සේවකයින්ට කිසිදු පිළියමක් යොදා නොමැති බවත් ආණ්ඩුව මේ සම්බන්ධයෙන් සාධාරණ පිළිතුරක් ලබාදෙන තෙක් රට පුරා හෝටල් සේවකයින් ඒකාබද්ධ කරගනිමින් මෙම උද්ඝෝෂණ තීව්‍ර කිරීමට කටයුතු කරන බවද අලුත්ගමදී පැවැත්වූ උද්ඝෝෂණය අතරතුර ජානක අධිකාරී සහෝදරයා පැවසීය.

## 36%කින් වැටුප් වැඩි නොකළොත් ලංවිම වැඩවර්ජනයකට




වසර 3කට වරක් සිදුවිය යුතු වැටුප් වැඩිවීම විදුලිබල සේවකයින්ට 2021 ජනවාරි සිට හිමිවිය යුතු වුවත් මේ දක්වා එම වැඩිවීම ලබා දී නොමැති අතර මෙයට අදාළව 2021 මාර්තු 23වැනි දින විදුලි බල මණ්ඩල සභාපතිවරයා සමග පැවැති සාකච්ඡාව අසාර්ථක වී ඇත. මෙයට විරෝධය දක්වමින් රට පුරා සිටින ලංවිම සේවකයෝ පසුගියදා කොළඹට පැමිණ විදුලි බල මූලස්ථානය ඉදිරිපිට දැවැන්ත උද්ඝෝෂණයක නිරත වූහ. මෙම උද්ඝෝෂණය සඳහා ලංවිම ඒකාබද්ධ වෘත්තීය සමිති සන්ධානයේ සම කැඳවුම්කරු රංජන් ජයලාල් ඇතුළු වෘත්තීය සමිති නායකයෝ සහ රට පුරා සිටින විදුලි සේවකයෝ සහභාගි වූහ.

## වැටුප් වැඩි නොවීමට එරෙහිව ජල සම්පාදන සේවකයෝ විරෝධතාවයේ



ජල සම්පාදන සේවකයින් සඳහා වසර තුනෙන් තුනට වැඩිවන නව වැටුප් වැඩිවීම 2021 ජනවාරි මස සිට ලැබිය යුතු වූවද එය මෙතෙක් නොලැබීමට එරෙහිව ඔවුහු පසුගියදා ගොලුමඩම ජල සම්පාදන මූලස්ථාන කාර්යාලය ඉදිරිපිට විරෝධතාවයක් පැවැත්වූහ.

මණ්ඩලීය පරිපාලනය සහ ඇමතිවරයා සමඟ කළ සාකච්ඡාවලදී පිළිගත හැකි නිශ්චිත පිළිතුරු මෙතෙක් ලැබී නොමැති බැවින් ජල සම්පාදන වෘත්තීය සමිති ඒකාබද්ධ සන්ධානය මෙම විරෝධතාවය පැවැත්වීමට කටයුතු කර තිබිණි.

මෙම ඉල්ලීම් මුල්කරගෙන ආරම්භ කරන විරෝධතාවයන්ට නිසි සවන්දීමක් සිදු නොවන්නේ නම් ඉදිරියේදී වැඩවර්ජන ක්‍රියාමාර්ගවලට එලැඹීමටද සූදානමින් සිටින බව ජල සම්පාදන වෘත්තීය සමිති ඒකාබද්ධ සන්ධානයේ සම කැඳවුම්කරු උපාලි රත්නායක සහෝදරයා නියමුවා වෙත පැවසීය.

## විශ්‍රාම වැටුප් කප්පාදුවට එරෙහිව විශ්‍රාමිකයින්ගෙන් ජනාධිපතිට ටෙලිමේල්



විශ්‍රාම වැටුප් කප්පාදුවට එරෙහිව පසුගිය මාර්තු 15 දින රට පුරා සියලු දිස්ත්‍රික්ක ආවරණය කරමින් ටෙලිමේල් යැවීමේ වැඩසටහනක් පැවති අතර විශ්‍රාමිකයින්ගේ හිමිකම් සුරැකීමේ ජාතික සංවිධානයේ නියෝජිතයෝ ඒ සඳහා සහභාගි වූහ. " අහිමි කරන ලද විශ්‍රාම වැටුප කරුණාකර ලබාදෙන්න" යනුවෙන් සටහන් කරන ලද එම ටෙලිමේල් පණිවිඩය ජනාධිපතිවරයා වෙත යවන ලද අතර එම විශ්‍රාමිකයින්ගේ හිමිකම් සුරැකීමේ ජාතික සංවිධානයේ ලේකම් සරත්ලාල් පෙරේරා සහෝදරයා ඇතුළු සංවිධානයේ සාමාජිකයින් කොළඹ බොරැල්ල තැපැල් කාර්යාලයේදී එම පණිවුඩ යැවීම සිදුකළහ.

## කල්ලියකට තීන්දු ගැනීමේ බලය දීමෙන් අහිමි වන්නේ ජනතාවගේ බදු මුදලුයි

### ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහෝදරයා




ආණ්ඩුව විසින් සීමිත කල්ලියකට කුප්‍රකට ගනුදෙනු සඳහා තීන්දු තීරණ ගැනීමේ බලය ලබාදී ඇති බවත් මෑතක සිදුවූ සීනි බදු වංචාව සහ පෙර ආණ්ඩු සමයේ බැඳුම්කර වංචාව සිදුවූයේ මෙවැනි තත්වයක් තුළ බවත් පෙන්වා දුන් ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහෝදරයා, මෙම කුප්‍රකට ගනුදෙනු මගින් අහිමි වන්නේ රටේ ජනතාවගේ බදු මුදල් බවත් ප්‍රකාශ කළේය.

විජිත හේරත් සහෝදරයා මේ අදහස් පළ කළේ පසුගිය 14වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පැවති මාධ්‍ය සාකච්ඡාවකදීය. මෙහිදී වැඩිදුරටත් කරුණු දැක්වූ ඔහු මෙසේද පැවසීය.

" සීනි ආනයන ගනුදෙනුවේදී මුදල් අමාත්‍යාංශය සඳහන් කරන රු. බිලියන 15.9ට වඩා පාඩුවක් සිදුවී තිබෙනවා. විල්මා ආයතනය විසින් ආනයනය කරන ලද සීනි සතොස ආයතනය විසින් මිලදී ගෙන තිබුණේ රු.120, රු.122, රු.127 වැනි මිල ගණන්වලටයි. නමුත් සතොස විකිණිය යුතුව තිබුණේ සීනි කිලෝව රු.85ටයි. එම පාඩුව ගණන් හදලා නැහැ. එය ජනතාවට සිදුවුණ පාඩුවක්. එතන අයථා ගනුදෙනුවක් නොතිබුණා නම් සතොස සභාපතිවරයා ඉවත් කරන්නේ ඇයි? ඔහු සතොසෙන් ඉවත් කොට ජනාධිපතිවරයා ළඟට ගන්නේ ඇයි? පාරිභෝගික සේවා අධිකාරියෙන් රු.85ට සීනි විකිණිය යුතු බවට ගැසට් කොට තිබියදී එකසිය විසි ගණන් වලට සතොසට සීනි ගන්නේ දැනුවත්වමයි. එනිසා එතන අක්‍රමිකතාවයක් තිබෙන බව පැහැදිලියි. ආණ්ඩුවට හිතවත් කල්ලියක් තමයි මේ ගනුදෙනුව පිටිපස්සේ ඉන්නේ.

මහ බැංකු බැඳුම්කර ගනුදෙනුවේදීත් සිදුවුණේ මෙවැනිම වංචාවක්. මහ බැංකුවේ අධිපති අර්ජුන මහේන්ද්‍රන් බැඳුම්කරවල පොලී ප්‍රතිශත වෙනස් කරන්න තීරණය කරනවා. බෑනට කියනවා, බැඳුම්කර වැඩිපුර ගන්න කියලා. මාමයි බෑනයි එකතු වෙලා ඒ ගනුදෙනුව කළා. එසේනම් කෙනෙකුට තර්ක කරන්න පුළුවන් මහ බැංකුවට පුළුවන් පොලී ප්‍රතිශත වෙනස් කරන්න පුළුවන් කියලා. පාර්ලිමේන්තුවේ කෝප් කමිටුවේ මේ වංචාව පිළිබඳ විවාදයේදී ෆුට්නෝට් කල්ලිය කිවුවේ මහ බැංකු බැඳුම්කර සිද්ධියේදී අලාභයක් නොව අවාසියක් සිදුවුණු බව වාර්තාවේ ලියන්න කියලා. දැන් සීනි බදු වංචාව කරපු අය කියන්නේත් මේක පාඩුවක් නෙවෙයි අවාසියක් කියලා. මේ දෙකේම වුණේ වංචාවක්.

සීනි තොග තිබියදී බදු වෙනස්කොට සීනි ගෙන්වීමට අවස්ථාව සලසා දුන්නේ මුදල් අමාත්‍යාංශය දැනුවත්වමයි. එනිසා මහ බැංකු බැඳුම්කර වංචාව හා සමානවම සීනි ගනුදෙනුවේ වංචාවක් සිදුවී තිබෙනවා. පහුගිය ආණ්ඩුව මහබැංකුව මංකොල්ල කෑවා. මේ ආණ්ඩුව සීනිවලින් මංකොල්ල කෑවා. උනුත් එකයි මුනුත් එකයි. භාණ්ඩාගාර ලේකම්වරයා චක්‍රලේඛ නිකුත් කරලා සීමිත කල්ලියකට තීන්දු-තීරණ ගැනීමේ නීත්‍යානුකූල බලය හදන්නේ මෙවැනි කුප්‍රකට ගනුදෙනු සඳහා නීත්‍යානුකූල බලය ලබා දෙන්නයි. එයින් අහිමි වෙන්නේ මේ රටේ ජනතාවගේ බදු මුදල්. එනිසා මෙම බදු අඩුකිරීම් කළේ ජනතාවට සහන දෙන්න නොව වංචාවක් සිදුකිරීමට බව ඉතාම පැහැදිලියි.

එනිසා අපි ආණ්ඩුවට කියනවා මේ පිළිබඳව විශේෂ පරීක්ෂණයක් කරලා මෙම තීන්දු තීරණ ගැනීමට හවුල් වූ සියලු දෙනාට නීතිය ක්‍රියාත්මක කරන්න කියලා. එසේ නොමැතිව විවිධ මාතෘකා හදලා ජනතා අවධානය වෙනතකට යොමු කරලා සීනි වංචාව යට ගහන්න උත්සාහ කරන්න එපා කියලා අපි ආණ්ඩුවට අවධාරණය කරනවා."

## ජිනීවාහිදී පරාජය වූයේ රට නොව ආණ්ඩුවේ ප්‍රතිපත්තියයි

### ජනතා විමුක්ති පෙරමුණේ ජාතික සංවිධායක බිමල් රත්නායක සහෝදරයා




ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයාගේ පාලන සමය තුළ රටේ ප්‍රජාතන්ත්‍රවාදය, ආර්ථිකය, මානව හිමිකම් ක්ෂේත්‍රය, වගේ සියලුම ක්ෂේත්‍රවල විශාල බිඳවැටීමක් තිබෙන බව ආණ්ඩුවට ඡන්දය දුන් ජනතාව පවා දැන් පිළිගන්නා බවත් අසාර්ථක දේශීය ප්‍රතිපත්තියකට ලෝකය දිනීමට නොහැකි බවත් කියා සිටි ජනතා විමුක්ති පෙරමුණේ ජාතික සංවිධායක බිමල් රත්නායක සහෝදරයා, ජිනීවා මානව කවුන්සිලයේදී පරාජය වී තිබෙන්නේ ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයාගේ දේශීය දේශපාලන ප්‍රතිපත්තිය බව පෙන්වා දුන්නේය.

බිමල් රත්නායක සහෝදරයා මෙම කරුණු හෙළි කළේ පසුගිය 24වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පවත්වන ලද මාධ්‍ය සාකච්ඡාවකදීය. මෙහිදී වැඩිදුරටත් අදහස් දක්වමින් ඔහු මෙසේද කියා සිටියේය.

"අනෙක් අතට ජිනීවා පරාජයෙන් පැහැදිලි වෙන්නේ ගෝඨාභය රාජපක්ෂ මහතාට මේ රට ආරක්ෂා කරන්න බැහැ කියන එකයි. රට ආරක්ෂා කිරීම කියන්නේ හමුදාව යොදවා කරන දෙයක් විතරක් නෙවෙයි කියලා අපි මීට පෙර පැහැදිලි කර තිබෙනවා. විදේශීය බලවේගවලින් එල්ල වෙන පීඩනයකින් රට ආරක්ෂා කර ගත හැකිවන්නේ නිවැරදි විදේශ ප්‍රතිපත්තියක් පවත්වාගෙන යාමෙනුයි. ඒ අනුව ගෝඨාභය රාජපක්ෂ පෙන්නුම් කර තිබෙන්නේ ජිනීවාවලින් රට ආරක්ෂා කර ගන්න ඔහු අසමත් බවයි. අනෙක් නරකම දේ ජිනීවා ඡන්ද පරාජයෙන් පස්සේ ආණ්ඩුවේ නායකයන් තමන්ගේ වැරැද්ද බාරනොගෙන උද්දච්ච මෝඩ ලෙස හැසිරෙනවා. විශේෂයෙන් විදේශ අමාත්‍යවරයා තමන්ගේ වැරැද්ද බාරගන්නේ නැහැ. මේ නිසා කවදාවත් වැරැද්ද හදාගෙන නැවත දිනන්න බැහැ. විදේශ ඇමතිවරයා නවතම ගණිත සංකල්ප ඉදිරිපත් කරමින් තවදුරටත් මුළු ලෝකයේම හැල්ලුවට ලක්වෙනවා. ජිනීවා ඡන්ද ප්‍රතිඵලයෙන් මෙන්න මේ මූලික කාරණා ඔප්පු වෙනවා.

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමසාරිස්තුමියගේ වාර්තාවෙන් හෝ ශ්‍රී ලංකා රාජ්‍යයට, ශ්‍රී ලංකාවේ ජනතාවට සෘජුව බලපාන කිසිදු යෝජනාවක් සම්මත කර නැහැ. ආණ්ඩුව තමන්ගේ දුෂ්ට, ඒකාධිපති අරමුණු වෙනුවෙන් වැඩකරලා, මුළු රටක් ලෝකයා ඉදිරියේ අපකීර්තියට පත්කරලා තිබෙන්නේ. රටට එරෙහි ගමන යන්නේ රාජපක්ෂ ආණ්ඩුව කියන මේ කල්ලිය පමණයි. ඒ නිසයි ආණ්ඩුවට ඡන්දය දුන් අයවත් අද නැත්තේ. වෙනදා ජිනීවා මානව හිමිකම් කවුන්සිලයේ යෝජනාවක් එනකොට මේ පිළිබඳව විරෝධතා දක්වන රාජපක්ෂ දේශපාලනයට බොහොම හිතවත් ස්වාමීන් වහන්සේලාවත් මෙවර විරුද්ධව උද්ඝෝෂණය කළේ නැහැ. උන්වහන්සේලාටවත් ආණ්ඩුව කරන දේවල් එක්ක පෙනී ඉන්න බැහැ. ජාතික මාමක කතාවලින්, සිංහ කොඩිය පෙන්වමින්, ආණ්ඩුවට තමන්ගේ දේශපාලන අපරාධ වහගන්න බැහැ.

ලංකා ආණ්ඩුව මානව හිමිකම් රකිමින්, අධිකරණ පද්ධතියේ ස්වාධීනත්වය රකිනවා නම් ලෝකයේ වැඩි ප්‍රමාණයක රටවලින් ජිනීවා දිනන්න පුළුවන්. ලංකාව පරාජය වීම, නමට කැලලක් ඇතිවීම සම්බන්ධයෙන් මේ රටේ ජනතාවවත් වෙන කෙනෙක්වත් වගකිය යුතු නැහැ. ඒකට වගකිව යුත්තේ අපේ රට වෙනුවෙන් අනික් රටවලින් ඡන්දයක් දෙන්න බැරි මට්ටමට පත් කළ ගෝඨාභය රාජපක්ෂ පාලනයයි. දැන්වත් උද්දච්චකම අතහැරලා වැරැද්ද පිළිගන්න ඕනෑ. ඊළඟ සැරේ ඡන්දය දිනන්න ඕනෑ නම් මානව හිමිකම් රකින්න කියලා අපි ආණ්ඩුවට බලකර කියා සිටිනවා. ජිනීවා දිනන්න නම්, 20වැනි සංශෝධනය අහෝසි කරන්න. ජිනීවා දිනන්න නම්, ඒකාධිපති මිලිටරිකරණය නතර කරන්න. ජිනීවා දිනන්න නම්, මාධ්‍යයට කරන තර්ජන ගර්ජන නතර කරන්න කියලා අපි අවධාරණය කරනවා. අඩුම ගාණේ ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව රට පාලනය කරන්න කියලා අවධාරණය කරනවා."

නියමුවා
ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත
464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com

# සදා නොමියෙන අප්‍රේල් මතකය

1971 අප්‍රේල් අරගලයට වසර 50ක් හෙවත් අඩ සිය වසරක් සැපිරී තිබේ. අඩ සියවසක ඇවෑමෙන් පසුත් අප්‍රේල් අරගලය, එහි බලපෑම හා එහි අත්දැකීම් තවමත් ජීවමානව පවතී. එය ඉතිහාසයේ නොමියෙන මතකයක්ව, සදාකල් පවතින බව ඉතා පැහැදිලිය. ඒ අප්‍රේල් අරගලය ලංකාවේ පසුගාමී, අධිරාජ්‍ය ගැති, පරාධීන ධනේශ්වර ක්‍රමයට එරෙහිව සමාජවාදය ප්‍රාර්ථනා කළ තරුණ පරපුරක පැත්තෙන් එල්ල වූ පළමු වෙඩිමුරය නිසාය. ලාංකේය ධනේශ්වර ඉතිහාසයේ නිර්ධන පංතියේ පැත්තෙන් ධනවාදයට එරෙහිව නිර්මාණය වූ පළමු අවිගත් නැගිටීම නිසාය. ධනවාදය විසින් පීඩාවට පත්කොට සිටින ජනතාවක් සදාකාලිකවම එම පීඩනය දරාගෙන නොසිටින බවත් පීඩනයට, මර්දනයට එරෙහිව පෙරළා නැගී සිට ප්‍රතිචාර දක්වන බවත් මුළුමහත් ඉතිහාසය මෙන්ම අප්‍රේල් අරගලය විසින්ද අපට උගන්වනු ලැබ ඇත.

ඓතිහාසික කොමියුනිස්ට් ප්‍රකාශනයේ ආරම්භයේදීම මාක්ස් - එංගල්ස් සඳහන් කළ සත්‍යයක් තිබේ. ඒ "මෙතෙක් පැවති සමාජයන්ගේ ඉතිහාසය (ලිඛිත ඉතිහාසය) වූ කලී පංති සටන්වල ඉතිහාසයක්"ය යන්නය. එහිදී හැම පංති සමාජයක් තුළම පීඩකයා හා පීඩිතයා අතර අනවරත සටනක්, එක්කෝ ජයග්‍රහණයෙන් කෙළවර වූ නැතිනම් සටන් කරන පංතියේ විනාශයෙන් කෙළවර වූ සටනක් පැවති බව මාක්ස් - එංගල්ස් පැවසූහ. 71 අප්‍රේල් අරගලයද එම පංති සටන් ක්‍රියාවලියේම, පීඩාවට එරෙහිව පීඩිතයින් විසින් කරන ලද සටන්වලටම අයත් තවත් එක් සටනක් විය.

71 අප්‍රේල් අරගලය ලංකාවේ එදා පැවති හා වර්ධනය වූ සමාජ, ආර්ථික, දේශපාලන හේතු විසින්ම නිර්මාණය කරනු ලැබුවක් මිස එය හුදු අහම්බයක් හෝ පුද්ගල හිතුවක්කාරකමක ප්‍රතිඵලයක් නොවීය.

අප්‍රේල් අරගලයේ විශේෂ වැදගත්කම කුමක්ද? ලංකාවේ ධනපති ක්‍රමය තුළ මානව ගරුත්වය හා අයිතිය අහිමි කළ ජනතාවක්, ප්‍රාග්ධනයේ වහලුන් බවට පත් කළ ජනතාවක්, ධනවාදී ප්‍රභූ පාලනයේ රාජ්‍යය හා මතවාදය විසින් පීඩාවට හා අවමානයට පත්කළ ජනතාවක්, ධනවාදී වියගස තම ගෙල තබා නිහඬවම, හිස පහත් කරගෙන, පීඩාවේ බර දරා සිටියෙදී, එය එලෙස දරා සිටිය යුතු නැතැයි විශ්වාස කළ තරුණ පරපුරක් ජනතාවගේ පෙරගමන්කරුවන් ලෙස ඉදිරිපත්ව ධනේශ්වර පීඩාවට එරෙහිව අවිගෙන නැගී සිටීමය. අයුක්තියට, අසාධාරණයට එරෙහිව සටන් වැදීමට තමන්ට ශුද්ධ වූ අයිතියක් ඇති බව භාවිතයෙන්ම පෙන්වීමය. දණින් වැටී ජීවත්වනවාට වඩා දෙපයින් සිට මියයාම උතුම් බව ලොවට හඬගා පැවසීමය. අපේ පංතිය නිවට නියාලුව සිටිය යුතු එකක් නොව ධනවාදී හා අධිරදවාදී බලකොටු සොලවා දැමීමට තරම් ශක්තියක් හා සටන්කාමීත්වයක් අප සතු බව පෙන්වීමය. අප්‍රේල් අරගලයේ දිවිපිදූවන් අපට වීරවරියන්, වීරවරයින් වන්නේ ඒ නිසාය.

අප්‍රේල් අරගලය අපේ පංතියට තම ශක්තිය පිළිබඳව අලුතින් සිතීමට, දිරියෙන් පිබිද ඒමට, දෙපයින් නැගී සිටීමට, අරමුණ වෙනුවෙන් කැප කිරීමට, විශ්වාසයෙන් සටන් කිරීමට ඉගැන්වූවා සේම, ධනපති පාලක පංතියටද ඔවුන්ගේ බලය අභියෝගයට ලක්ව ඇති බවට, නිර්ධන පංතිය නොසලකා සිටිය නොහැකි බවට පාඩම් උගැන්වීය. 75 ඉඩම් ජනසතු කිරීම, 72 ජනරජ ව්‍යවස්ථාව හැදීම, තරුණ කටයුතු පිළිබඳ ධනේශ්වර ආයතන පිහිටුවීම වැනි ආර්ථික, දේශපාලන ප්‍රතිසංස්කරණ කීපයකටම ධනපති පංතිය යොමුකරන ලද්දේ 71 අප්‍රේල් අරගලයේ බලපෑම විසිනි. ඒ අර්ථයෙන් ගත්විට අප්‍රේල් අරගලය තාවකාලිකව පරාජය වුවද එය සමාජයට ජයග්‍රාහී සටනක් සඳහා අත්දැකීම් හා මඟපෙන්වීමද, ධනේශ්වර ප්‍රතිසංස්කරණද දිනා දී තිබේ.

'වහලුන් පාරාදීසය අල්ලා ගැනීම' ලෙස මාක්ස් විසින් හඳුන්වන ලද පැරිසියේ කම්කරුවන් විසින් එහි බලය තමන් අතට ගැනීම හෙවත් ලොව පළමු කම්කරු රාජ්‍යය ලෙස පැරිස් කොමියුනය පිහිටුවීම සිදුවූයේ 1871 මාර්තුවලය. 1971 අප්‍රේල් අරගලය සිදුවූයේ ඉන් හරියටම සියවසකට පසුවය. දැන් අප්‍රේල් අරගලයට වසර 50ක් වන අතර පැරිස් කොමියුනයට වසර 150කි. පැරිස් කොමියුනය ගැන මාක්ස් සඳහන් කළ අර්ථයෙන්ම ගත් විට, අප්‍රේල් අරගලයද ධනපතින්ගේ පාරාදීසයට එරෙහිව 'ශ්‍රමයේ වහලුන්' විසින් එල්ල කරන ලද දැවැන්ත ප්‍රහාරයක් විය. පැරිස් කොමියුනය දින 72කින් බිඳවැටුන අතර අප්‍රේල් අරගලය දින කිහිපයකින් පරාජය විය. මෙම සිදුවීම් දෙකේම විවිධ අඩුපාඩු තිබූ නමුත් අරමුණත්, අභිප්‍රායත්, සටනත් සමාජ ප්‍රගතිය නියෝජනය කිරීමේ පැත්තෙන් විශාල ඉදිරි පියවරයන් විය. එබැවින් අරගලය තුළ පැවති නොවැළැක්විය හැකි අඩුපාඩු නිසා, දුබලතා නිසා එම අරගලයේ ශ්‍රේෂ්ඨත්වය, විශිෂ්ටත්වය, ගෞරවනීයත්වය මදකින් හෝ අඩු වන්නේ නැත.

මාක්ස් ලියූ 'ප්‍රංශයේ ප්‍රජා යුද්ධ' නම් ලිපිය අවසානයේ පැරිස් කොමියුනය ගැන ඔහුද මෙසේ සඳහන්කර තිබුණි. "පැරිසියේ කම්කරුවන් හා ඔවුන්ගේ කොමියුනය නව සමාජයේ පෙරමඟ ලකුණු කියන තේජාන්විත අග්‍ර දූතයා ලෙස සැමදා ගරුබුහුමන් ලබනු ඇත. වධවලට භාජනය වූ කොමියුනයේ වීරයෝ කම්කරු පංතියේ ශ්‍රේෂ්ඨතම හදවත් තුළ සදහටම තැන්පත්වී සිටිති. එහි වධකයින්, ඔවුන්ගේ පූජකකයින්ගේ සියලු යාඥාවලින් වුව ගලවා ගැනීමට නොහැකිවනසේ අපකීර්තියේ කණුවට තබා ඉතිහාසය විසින් දැනටමත් ඇණ ගසා ඇත."

පැරිස් කොමියුනය ගැන මාක්ස් පැවසූ මේ වදන් එලෙසින්ම අප්‍රේල් අරගල පිළිබඳවද එහි වීරයින් හා වධකයින් පිළිබඳවද එකසේ සත්‍ය බව අපි විශ්වාස කරමු. අප්‍රේල් අරගලයේ අත්දැකීම, අප්‍රේල් විරුවන්ගේ හඬ, ඔවුන්ගේ අරමුණු ජය ගැනීම වෙනුවෙන් අපේ හදවත් තුළ සදාකාලයට පවතිනු ඇත. අප්‍රේල් අරගලයත්, දිවිපිදූවනුත් සදා අමරණීය වනු ඇත. අනාගතයේ නිසැක ලෙස ඔවුන්ගේ අරමුණු ජය ගන්නවා ඇත.

# ධනවාදයේ අර්බුදය වෙස්මුහුණු මාරු කරයිද?



මේ වනවිට ලංකාවේ ධනවාදී ක්‍රමය එහි ආර්ථික මොඩලය වූ නව ලිබරල්වාදය තුළ පෙර නොවූ විරූ අර්බුදයකට ලක්ව තිබේ. රටේ නිෂ්පාදන මාර්ග බිඳවැටී තිබේ. එක පුද්ගලයෙක් රු. ලක්ෂ 09ක ණයකාරයෙක් කරන දැවැන්ත ණය කන්දක් රට මත තිබේ. ආණ්ඩුවේ පමණක් වාර්ෂික ණය පොලී වාරිකය ඩොලර් බිලියන 6.7ක් වෙද්දී ලංකාවේ විදේශ සංචිතය ඩොලර් බිලියන 4.5ට වැටී තිබේ. රුපියල දිගින් දිගටම බාල්දුවෙද්දී බඩු මිල අහස උසට ගමන් කරමින් තිබේ.

ඒ අතර ජාවාරම්කරුවෝ රජයේ ආශිර්වාදය සහිතව නව ආර්ථික ව්‍යාපෘති වෙනුවෙන් ඉඩම් අත්පත් කර ගැනීම සඳහා රට පුරා කැලෑ කපමින් පරිසරය ඩෝසර් කරමින් සිටිති. ආණ්ඩුවද ජනාධිපතිවරයාද අසමත් බව ඔහුට ඡන්දය දුන් අයම ප්‍රසිද්ධියේ ප්‍රකාශ කරමින් සිටිති. ආණ්ඩුව වේගයෙන් ජනතා අප්‍රසාදයට පත්වෙමින් තිබේ. මුළු රටක ලක්ෂ 69ක් බලාපොරොත්තු තැබූ ජනාධිපති ගෝඨාභය ලංකාවේ අසමත්ම හා විහිළුකාරිම පාලකයා බවට පත්ව සිටියි. ගෝඨාභය ඇතුළු ආණ්ඩුවේ ජයග්‍රහණය වෙනුවෙන් කැඳවාගත් ජාතිවාදී හා ආගමික අන්තවාදී බලවේග තමන්ටම පාලනය කරගත නොහැකි භූත බලවේගවල තත්වයට වැටී තිබේ. මේ තත්වය ධනවාදී කඳවුරේ ආණ්ඩුවටත්, සජිත්ගේ විපක්ෂයටත් මෙතෙක් පැළඳ සිටි වෙස්මුහුණු මාරුකර ගැනීමට බල කර ඇති බවද පෙනේ.

පසුගිය දිනවල සමාජ මාධ්‍ය ඔස්සේ පැතිර ගිය ප්‍රවෘත්තියකින් කියවුණේ ගෝඨාභය රාජපක්ෂ මීළඟ වතාවේ ජනාධිපතිවරණයට තරග නොකරන බවත් ඒ වෙනුවට බැසිල් රාජපක්ෂ තරග කිරීමට සූදානම් බවත්ය. ආණ්ඩුව තුළ සිටින වීරවංශ, ගම්මන්පිල, වාසු වැනි කුඩා පක්ෂවල හිමිකරුවෝ තමන්ට ආණ්ඩුව තුළ ඇතිවී තිබෙන කුඩම්මාගේ සැලකිල්ල ගැන පැමිණිලි කරමින් ඊට විසඳුමක් ලෙස ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ නායකයා මහින්ද රාජපක්ෂ ලෙස සිටිමින්ම ගෝඨාභය සන්ධානයේ නායකත්වය බාරගත යුතු යයි ජනාධිපතිවරයා හමුවී ඉල්ලා තිබේ. තමා නැවත තරග නොකරන බවත්, තමා දේශපාලනය නොකරන නිසා සන්ධාන නායකත්වය බාරගැනීමට නොහැකි බවත් ගෝඨාභය පවසා ඇත්තේ එහිදීය. එපමණක් නොව ඊළඟ ජනාධිපතිවරණයේදී තනි සිංහල බෞද්ධ ඡන්දවලින්ම පමණක් ජයගත නොහැකි බවත් ඒ නිසා සුළුජාතික ඡන්ද දිනාගත යුතු බවත් එම හැකියාව ඇත්තේ බැසිල්ට බවත් පවසා ඇත්තේ එහිදීය. මෙය සමාජය තුළ පැතිරෙද්දී ආණ්ඩුව එය එසේ නොවේයයි කියාද නැත.

ඒ අනුව පෙනී යන්නේ වරක බලය වෙනුවෙන් අවුස්සා ගොඩනගා ඔසවාගත් 'තනි සිංහල බෞද්ධ ආණ්ඩුව' නැමති ව්‍යාජ සටන් පාඨයත් ඊට ගැලපෙන ලෙස පැළඳි වෙස්මුහුණත් මාරුකිරීමට දැන් ආණ්ඩුව සූදානම් වන බවය. 20වැනි සංශෝධනය සම්මත කර ගැනීමට සහය ලබා ගනිමින් මුස්ලිම් ධනපති දේශපාලකයින් සමග 'ඩීල්' දැමූ ආණ්ඩුව දැන් සුළුජාතික ඡන්ද දිනාගැනීම වෙනුවෙන් තමන්ගේ 'ලයින් එක' වෙනස් කරමින් සිටීද යන්න විමසා බැලිය යුතුය. මේ දිනවල ආණ්ඩුව තුළ සිදුවන 'දෙලොවක් අතර' වර්ගයේ සිදුවීම් ඉහත කරුණු තහවුරු කරන බව පෙනේ.

ආණ්ඩුව කාරොනාවලින් මියගිය මුස්ලිම් මරණ භූමදානය කිරීමට අවසර දීම ප්‍රමාද කළේ සිංහල ජාතිවාදී බලවේගවලින් එන පීඩනය නිසා බව පැහැදිලිය. එහෙත් අනෙක් අතට ඒ අස්සේම මුස්ලිම් නායකයින් දිනාගැනීමටද කටයුතු කළේද යන්න පිළිබඳව, 20වැනි සංශෝධනයට සහාය පැතීමේදී මුස්ලිම් මන්ත්‍රීවරුන්ට දුන් රහසිගත පොරොන්දුව එනම් කොවිඩ් මරණ භූමදානයට ඉඩදෙන බවට වූ පොරොන්දුව උපක්‍රමශීලීව ඉටුකළේද යන්න පිළිබඳ සැක මතුවන සිදුවීම් ඇතිවී තිබේ. (අපේ ස්ථාවරය වූයේ ලෝක සෞඛ්‍ය සංවිධාන උපදෙස් මත එම මරණ භූමදානයට ඉඩදිය යුතු බවය) එනම් නැගෙනහිර පළාතේ මුස්ලිම් නායකයෙක් වූ නසීර් අහමඩ් මහතා මිනීපෙට්ටි 180 ගණනක් පිළිස්සූ බවත් දේහයන් ආදාහනය කළ බවත්, ආණ්ඩුව ඊට උදව් කළ බවත් කුකුසක් දනවන අන්දමින් ප්‍රකාශ කිරීම තුළය.

අනෙක් අතට මෑතකදී සරත් වීරසේකර ඇමතිවරයා බුර්කාව තහනම් කරන නීති සහිත කැබිනට් පත්‍රිකාවට තමා අත්සන් කළ බව පැවසුවිට ආණ්ඩුවේ ප්‍රබලයෝ එය ප්‍රතික්ෂේප කරමින් පැවසුවේ තවම එවැනි තීරණයක් ගෙන නැති බවය. එවැන්නක් සඳහා හදිසියක් නැති බවද ආණ්ඩුවේ සමහරු පැවසූහ. මෙම කරුණු දෙස බලනවිට පෙනෙන්නේ ආණ්ඩුව සුළුජාතික ඡන්ද විරුද්ධ කර නොගැනීම සඳහා අවබෝධයෙන් කටයුතු කරන බවය. දැනටමත් වැළැක්විය නොහැකි ලෙස ගෝඨාභයට විවිධ හේතු මත ඡන්දය දුන් සිංහල බෞද්ධ ඡන්ද රැසක් අහිමිවෙමින් තිබෙන හා ඒවා යළි රැකගත නොහැකි තත්වය තුළ ඔවුන් යළි දමිළ හා මුස්ලිම් ඡන්ද රවටා දිනාගැනීම දෙසට හැරෙන්නේ නම් එය පුදුම වීමට දෙයක් නොවේ. මන්ද බලය වෙනුවෙන් ඔවුන්ට ඕනෑම වර්ගයක වෙස්මුහුණක් පැළඳිය හැකි නිසාය.

ඒ අනුව ආණ්ඩුව බලය සඳහාම යොදාගත් තනි සිංහල බෞද්ධ වෙස්මුහුණ ක්‍රමානුකූලව පසෙක තබා බලය සඳහාම මුහුණු දෙකේ දෙබිඩි වෙස්මුහුණක් පළඳිනු ඇති බව පෙනෙන්නට තිබේ. එය ආණ්ඩුවේ ඉදිරි කාලයේ හැසිරීම විසින් තහවුරු කෙරෙනු ඇත.

ආණ්ඩුව තම ජාතිවාදී, ආගම්වාදී වෙස්මුහුණ මාරුකරන්නට කල්පනා කරද්දී දැන් සමගි ජන බලවේගයේ නායක සජිත් මෙතෙක් කල් එ.ජා.ප.යේ සිටියදී පැළඳ සිටි නව ලිබරල්වාදී මුහුණ පසෙකලා ජාතිකවාදී මුහුණක් පැළඳ ගැනීමට සූදානම් වනවාදැයි සැකයක් මතුවී තිබේ.

> මෙම කරුණු දෙස බලනවිට පෙනෙන්නේ ආණ්ඩුව සුළුජාතික ඡන්ද විරුද්ධ කර නොගැනීම සඳහා අවබෝධයෙන් කටයුතු කරන බවය. දැනටමත් වැළැක්විය නොහැකි ලෙස ගෝඨාභයට විවිධ හේතු මත ඡන්දය දුන් සිංහල බෞද්ධ ඡන්ද රැසක් අහිමිවෙමින් තිබෙන හා ඒවා යළි රැකගත නොහැකි තත්වය තුළ ඔවුන් යළි දමිළ හා මුස්ලිම් ඡන්ද රවටා දිනාගැනීම දෙසට හැරෙන්නේ නම් එය පුදුම වීමට දෙයක් නොවේ. මන්ද බලය වෙනුවෙන් ඔවුන්ට ඕනෑම වර්ගයක වෙස්මුහුණක් පැළඳිය හැකි නිසාය.

මෑතකදී කොළඹ හයිඩ්පිටියේ පැවැත්වූ සමගි ජන බලවේගයේ සංවත්සරයකදී සජිත් ප්‍රේමදාස කළ කතාවේ කරුණු දෙකක් අවධානයට යොමු කළ යුතු ඒවා බව පෙනේ. ඔහු එහිදී නව ලිබරල් ආර්ථික ක්‍රමය අත්හරින බවටත්, ජාතික ආර්ථිකයක් ගෙනෙන බවටත් ප්‍රකාශ කර තිබූ අතර අනෙක් අතට ලංකාවේ ප්‍රතිපත්තිගරුක හොඳම බෞද්ධ නායකයා තමන්ගේ පියා බවත් ඒ අනුව හොඳම බෞද්ධයා වීමේ හැකියාව ඇත්තේ තමන්ට බවත් පවසා තිබුණි. ඉන් ඇඟවෙන කරුණ කුමක්ද? සජිත්ලාද මෙතෙක් කරගෙන ආ නව ලිබරල්වාදය අතහරින බවට බොරුවක් සමාජගත කිරීමටත්, ජාතිකවාදී හා සිංහල බෞද්ධ වෙස්මුහුණක් පැළඳ ජනතාව රැවටීමටත් සූදානම් වන බවය. ඒ බලය සඳහාමය.

අපේ රටේ ධනේශ්වර පාලන ඉතිහාසය පිරී ඇත්තේ මෙම රැවටීම්වලිනි. ජනතාවගේ සැබෑ ආර්ථික සමාජ ප්‍රශ්න විසඳිය නොහැකි ධනපති පක්ෂ එම ප්‍රශ්න වලට විසඳුම් ඉදිරිපත් කරනවා වෙනුවට හැම විටකම මැතිවරණවලදී ජනතාව රැවටීමේ අලුත් වෙස්මුහුණු පළඳිති. එවිට සැබෑ ප්‍රශ්න අමතක කරන ඡන්දදායකයෝ එම ව්‍යාජ මුහුණ, ප්‍රතිරූප හා සටන්පාඨ පිටුපස ගොස් උගුලේ හසුවෙති. ලංකාවේ හැමවිටකම ධනපති පාලකයින් තම වෙස්මුහුණු සඳහා යොදාගත්තේ ජාතිවාදය, ආගම්වාදය, හා බොරු දේශප්‍රේමයයි. අනෙක් අතට විවිධ ජාතිකත්වයන් රවටා ගැනීමය. දැන් සිදුවෙමින් තිබෙන්නේද එයමය. යළිත් රට තුළ එක් අතකින් ජාතිවාදය, ආගම්වාදය යොදාගැනීමටත් අනික් අතින් ප්‍රජාතන්ත්‍රවාදය යහපාලනය දඬමීමා කරගෙන බලයට ඒමටත්, ඊටත් වෙනස්ව එක් එක් ජන කණ්ඩායම්වලට වරදාන දී බලය තහවුරු කර ගැනීමටත් ධනපති දේශපාලන කණ්ඩායම් උත්සාහ කරමින් සිටින බව පෙනේ. බලය සඳහා මුහුණ මාරුකිරීම ඔවුන්ට සුළු දෙයකි.

මේ තත්වය මත ජනතාවට පැවරෙන්නේ විශාල වගකීමකි. ධනපති දේශපාලන නායකයන් විටින් විට පැළඳි ව්‍යාජ වෙස්මුහුණුවලට රැවටී මුළු ජීවිතයම ඛේදවාචකයක් කරගෙන සිටින මෙරට ජනතාව දැන්වත් මෙම වෙස්මුහුණුවලට නොරැවටීමට අදිටන් කරගත යුතුය. ජනප්‍රිය වෙස්මුහුණු පසෙකලා සැබෑ සමාජ ආර්ථික ගැටලු විසඳා ගැනීමට, සැබෑ ලෙසම සමාජය ඉදිරියට මෙහෙයවා ජීවිතය ජය ගැනීමට, ප්‍රතිපත්තිමය දේශපාලනයකට, සමාජයේ පැරණි අසමත් ක්‍රමය වෙනස් කළ හැකි දේශපාලනයකට යොමුවිය යුතුය. මේ ඒ සඳහා කාලය මිස යළි රැවටීම සඳහා අවස්ථාව නම් නොවේ.







YES WE CAN

# තරුණ නැගිටීමක සූදානම!...

තරුණ නැගිටීම ලෙස අපට සිහිවන්නේ 1971 තරුණ නැගිටීමයි. එය ලාංකේය ඉතිහාසයෙන් කිසිදා මකා දැමිය නොහැකි අපරාජිත අරගලයකි. එය අපරාජිත වන්නේ තරුණ නැගිටීමේ ප්‍රතිඵලයක් ලෙස ලාංකේය සමාජයට අත්පත් කරදුන් ජයග්‍රහණ බොහෝ නිසාය. මෙම තරුණ නැගිටීම නිසා සුදු අධිරාජ්‍යවාදීහු මෙන්ම ඔවුන්ට පක්ෂපාතී වූ දේශීය ධනපති පාලකයෝද බියෙන් තැතිගත්හ.

අදද තරුණ නැගිටීමක වුවමනාව අළු යට ගිනි මෙන් දැවෙමින් ඇත. මන්ද යත්, අවුරුදු 73ක් පුරා මේ අසමත් ධනවාදයෙන් පරම්පරා තුනක් බැටකමින් එහි ගොදුරු බවට පත්ව තිබීමත්, එයට එරෙහි වූ වත්මන් පරපුරේ වෙනසක බලාපොරොත්තුව පැහැරගත් වත්මන් රාජපක්ෂ පාලනය ඔවුන්ගේ බලාපොරොත්තු සිහින බවට පත්කර තිබීමත් නිසාය.

පැරණි ලෙසම රාජ්‍ය පාලනයට නුසුදුස්සන් පත්කිරීම් එමටය. දූෂණ, වංචා එසේමය. සීනි බදු වංචාව, මහ බැංකු වංචාව ඉක්මවා ගොස් ය. වඳ කොත්තු හා වඳ වෙන ආහාර පිළිබඳ මැවූ භීතිය නැතුවාට විස සහිත ආහාර පාන නොඅඩුව ජනතාවට කවනු ලැබෙමින් ඇත. අපරාධවලද අඩුවක් නැත. බෙල්ල කැපූ තරුණියන්ගේ මළ මිනී මහමඟය. මහමඟ මරා දමන, කාර්වල ගිනිතබා මරා දමන තරුණයන්ගේ අඩුවක් නැත. වන විනාශයේද අඩුවක් නැත. මුතුරාජවෙල, සිංහරාජය ඇතුළු ලෝක උරුම වනාන්තර පවා විනාශ කෙරෙමින් ඇත. එතැනින් නොනැවතී ඉතා වේගවත් ලෙස රටේ සම්පත් විදේශිකයන් සතු කෙරෙමින් ඇත.

මෙසේ තරුණ අපේක්ෂාවන් සිහින බවට පත්කර ඇති අසමත් ධනවාදය හා අසමත් ධනවාදී පාලකයින්ට එරෙහිව, අළු යට ගිනි මෙන් පුපුර පුපුරා ඇති තරුණ ගිනි පුලිඟු දැන් දැන් ඉස්මතු වෙමින් ඇත. වත්මන් පරපුරේ හදවත බඳු වන සම්පත විනාශයට එරෙහිව භාග්‍යාගේ හඬ මතුවන්නේ එහි ප්‍රතිඵලයක් ලෙසය. පාලකයින් කෙතරම් බලසම්පන්නද, කෙතරම් මර්දනකාරීද යන්න ඇයට අදාළ වූයේ නැත. ඈ තමා දුටු පරම සත්‍යය ජනතාවට හෙළිදරව් කළාය. එම හෙළිදරව්ව, පසුව විශාල ජනතා කතිකාවක්, ජනතා විරෝධයක් බවට පෙරළිණි.

තැනින් තැන මෙලෙස මතුවන ගිනි පුළිඟු අනාගතයේ දිනක මහා ගිනි ජාලාවක් ලෙස මේ අසමත් ධනවාදය දවා හළු කර දමනු නිසැකය. මන්දයත් මේ අසමත් ධනවාදය එහි අවසන් ඉමද පසුකර ඇති නිසාත්, වඩා දියුණු පරම්පරාවක් මේ සමාජයේ වගකියයුත්තන් බවට පත් වෙමින් තිබෙන නිසාත්ය.

නොවැළැක්විය හැකි ලෙසම හෙට දින පැනනගින තරුණ නැගිටීමකට එරෙහිව ධනපති පාලකයන් සූදානම් වෙනවා සේම එම ජයග්‍රාහී තරුණ නැගිටීමේ නායකත්වය ගැනීමට 71 තරුණ නැගිටීමෙන් පන්නරය ලැබූ පංතියේ පක්ෂය සූදානම් කරගැනීම නව පරම්පරාවේ වගකීම වන්නේය.

# කැලෑ කපන උන් හුරතල් කරන, ආණ්ඩුවේ නිර්ලජ්ජිත ක්‍රියාවට එරෙහිව

"කැලෑ කපන උන් හුරතල් කරන, සාමාන්‍ය තරුණියන් බයකරන ආණ්ඩුවේ නිර්ලජ්ජිත ක්‍රියාවට එරෙහි වෙමු" මැයෙන් නිහඬ විරෝධයක් පසුගිය මාර්තු 17 දින කොළඹ මානව හිමිකම් කොමිසම ඉදිරිපිටදී පැවැත්විණි. මෙය සංවිධානය කරන ලද්දේ සමාජවාදී තරුණ සංගමය විසිනි. පසුගියදා විද්‍යුත් නාලිකාවක් තුළ සිදු කළ වැඩසටහනකදී සිංහරාජය විනාශ කිරීමට එරෙහිව අදහස් පළ කළ භාග්‍යා අබේරත්න තරුණියට ආණ්ඩුව විසින් ගෙන යන අනිසි බලපෑම්, බියවද්දවීම් හා ප්‍රශ්න කිරීම් හේතුවෙන් ඇයට යම් මානසික බලපෑමක් ඇතිකිරීමත්, තාරුණ්‍යයේ අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය අහුරාදැමීමටත් එරෙහිව මෙම විරෝධතාවය පැවැත්විණි. එහිදී මෙම ආණ්ඩුවේ ක්‍රියාදාමයට එරෙහිව මානව හිමිකම් කාර්යාලයේදී පැමිණිල්ලක්ද ගොනුකරන ලදී.




# රැකියා විරහිත උපාධිධාරීන්ගේ ගැටලුවට මැදිහත් වෙමින්

රැකියා විරහිත උපාධිධාරීන්ගේ රැකියා ලබාදීමේදී මතුව ඇති ගැටලු සම්බන්ධව පසුගිය 22 දින රාජ්‍ය පරිපාලන අමාත්‍ය ලේකම්වරයා සමග සාකච්ඡාවක් පැවැත්විණි. එහිදී එහි ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂවරයා පවසා ඇත්තේ ගැටලු ඇති සියලු දෙනා සති දෙකක් ඇතුළත අභියාචනා බාර දෙන ලෙසත් ඉන් පසු ඒවා සොයා බලා රැකියා ලබාදීම සඳහා මැදිහත්වන බවත්ය. මේ සඳහා රැකියා විරහිත උපාධිධාරී ඒකාබද්ධ මධ්‍යස්ථානයේ කැඳවුකරු මහේෂ් අබේපිටිය සහෝදරයා හා රැකියා විරහිත උපාධිධාරීන් කිහිප දෙනෙක් සහභාගි වූහ.



## අධිරදයට එරෙහි විරුවන්

දරුණු අගාධයක් අභිමුව
හෙළා උන් මෙ දෙරණත
ධනපති ගුබ්බෑයමේ
රිංගා ගත් වමක්
ආශිර්වාද ලබමින්
ඉඳිද්දී ඇස් කන් පියාගෙන..
දන් දුන්නෙ ඉස්, මස්, ලේ
බෝසත් සිත් පෙරා
අරගලයේ හිස් මුදුනින්..
නුඹයි ඒ ආදර්ශය..
ලොවක අධිරද බලයට
අභියෝග කළ සිහසුනට
බයිනෙත්තු හඬවා
රැකගත් රටක්, රාජ්‍යයක්
කොල්ලකන අපූරුව
මේ කළු සුද්දන්...
හෙටත් ඒ අරගලයට
පණ දෙන්න ඇහැකි තව
ජවයත් අරන් නුඹ
එනවාද මෙබිමට
ධෛර්යයේ දෑත් ඔසවා...



## කොංගෝවෙන් රත්තරන් කන්දක් හමුවෙයි



අප්‍රිකානු මහද්වීපයේ පිහිටි කොංගෝ ජනරජයේ කිවියු පළාතේ පිහිටි ලුහිහි නම් ගම්මානයේ රත්තරන් පිරුණු කන්දක් හමුව තිබේ.
ගම්වැසියන් බොහෝ පිරිසක් මේ කන්දේ රත්රන් කැණීමේ නිරතව ඇත.
කෙසේ වෙතත් මෙලෙස කැණීම නීතිවිරෝධී බව පවසමින් එරට රජය ඊට තහනමක් පනවා ඇත. ඒ අනුව ජනතාව පස් කොටස් කඩා ගෙනැවිත් නිවෙස් වලදී ඒවා පිරිසිදු කරමින් රත්රන් ලබාගැනීමට කටයුතු කරති. මෙම කන්දේ පිහිටි රත්රන් පිරිසිදු රත්තරන් වීම විශේෂයකි.

## මියන්මාර ජනතාවගෙන් පච්චා විරෝධයක්



මියන්මාරයේ පවතින හමුදා පාලනයට සිය විරෝධය දක්වමින් එරට ජනතාව සිරුරු මත පච්චා කොටාගැනීමේ ප්‍රවණතාවයක් වාර්තා වේ.
මෙහිදී හමුදා කුමන්ත්‍රණයට එරෙහි වීමේ තේමාව යටතේ මෙම පච්චා නිර්මාණය කෙරෙන බව සඳහන් වේ.
එහිදී 'බියෙන් නිදහස් වෙමු', 'වසන්තයේ විප්ලවය' හා එරට නායිකා අවුන් සාන් සුකී ගේ ඡායරූපය හා ඇගේ දේශපාලනයේ සුප්‍රසිද්ධ ඇඟිලි 03 ආචාරය ආදී අංග පච්චා බවට පත් වෙමින් තිබේ. මෙහිදී පච්චා නිර්මාණකරුවන් නොමිලේම ජනතාවට පච්ච කෙටීම සිදුකරන බවත්, හමුදා පාලනය මියන්මාරයෙන් අතුගා දැමීම මෙහි අරමුණ බවත් ඔවුහු පවසා සිටිති.

## මියගිය ජෝර්ජ් ෆ්ලොයිඩ් වෙනුවෙන් ඩොලර් මිලියන 27ක වන්දි




ඇමරිකානු එක්සත් ජනපද පොලිස් නිලධාරියෙකු අතින් මියගිය කළු ජාතික ජේර්ජ් ෆ්ලොයිඩ් වෙනුවෙන් ඔහුගේ පවුල වෙත ඩොලර් මිලියන 27ක වන්දියක් ගෙවීමට එම නගර බලධාරීන් එකඟතාව පළ කර ඇත.
45 හැවිරිදි ජෝර්ජ් ෆ්ලොයිඩ්ගේ මරණය සුදු ජාතික පොලිස් නිලධාරියෙක්ගෙන් සිදු වූ ආකාරය වීඩියෝ පටයක සටහන්ව තිබුණි. ඒ අනුව මෙම මරණයෙන් පසු එක්සත් ජනපදයේ ආසන්න ඉතිහාසයේ දැවැන්තම කළු ජාතික විරෝධතාව සංවිධානය විණි. මෙහිදී විරෝධතාකරුවන් විසින් මිනියාපොලිස් නගරය ඇතුළු තවත් ස්ථාන රැසක් විනාශ කෙරිණි.

## මෘදුකාංග සමාගමක් විසින් ශබ්දයෙන් COVID 19 හඳුනා ගනී



යම් පුද්ගලයෙකුගේ කතාබහක හෝ කැස්සක ශබ්දයෙන් COVID 19 ආසාදිතයෙක් දැයි හඳුනාගත හැකි නව ක්‍රමයක් ඉතාලියේ Neosperience සමාගම විසින් නිෂ්පාදනය කර ඇත. මේ හරහා ස්වසන ආබාධ 80%ක් නිවැරදිතාවයකින් හඳුනාගැනීමේ හැකියාව පවතී.
එම සමාගම පවසන ආකාරයට මෙහීදී Cloud නම් කෘත්‍රිම බුද්ධිය යොදාගන්නා පරිඝණක වේදිකාවක් භාවිත කරමින් එහි ව්‍යාපෘතිය සංවර්ධනය කර ඇති.

බඩුමිල ඉහළට-ආර්ථිකය පහළට 'සිස්ටම් ෆේල්' සංවාදශීලී සම්මන්ත්‍රණය පසුගිය 10වැනි දින කොළඹ නව නගර ශාලාවේදී පැවැත්විණි. එහි ප්‍රධාන දේශනය ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර දිසානායක සහෝදරයා විසින් පවත්වන ලද අතර එම දේශනයේ සංක්ෂිප්ත ලිඛිත සටහන කාලීන වැදගත්කම සලකා මෙහි පළ වේ.

# සමාජ ආර්ථික දේශපාලනික පරිවර්තනයක් වෙනුවෙන් පෙළගැසිය යුතුයි

මේ වෙනකොට රටේ ප්‍රධාන මාතෘකා කිහිපයක්ම සාකච්ඡා වෙමින් තිබෙනවා. අපේ රටේ පුරවැසියනුත් පාලකයනුත් පවතින අර්බුදය විවිධ කෝණවලින් අර්ථකථනය කරනවා. මාළුවා පණුවා දකිනවා කොක්ක දකින්නේ නැහැ, කියලා කියමනක් තිබෙනවා. ඒ වගේ ජනතාවගෙන් බහුතරයක් සහ පාලකයන් කොක්ක ගැන අවධානය යොමු කරනවා වෙනුවට පනුවා ගැන අවධානය යොමු කරනවා. බඩුමිල ඉහළ යාම ආර්ථික අර්බුදය නෙවෙයි, අර්බුදයේ ප්‍රකාශනයක්. බඩුමිල ඉහළ යාමෙන් පාරිභෝගික ජනතාවට දැනෙන්නේ ආර්ථිකය කඩාවැටීම. උණ කියන්නේ රෝගයක් නොවෙයි. රෝගයක ප්‍රකාශනයක්. ඒ වගේම බඩුමිල ඉහළ යාම, රැකියා නොමැතිවීම, ගොවි ජනතාවට ගොවිතැනින් ජීවත්වීමට බැරිවීම, ධීවර ජනතාවගේ අස්වැන්න සාධාරණ මිලකට අලෙවිකර ගත නොහැකිවීම මගින් කියැවෙන්නේ ආර්ථික අර්බුදයේ ප්‍රකාශනය මිස අර්බුදය නෙවෙයි. එහෙම නම් අර්බුද ඇතිවෙන්නේ ආර්ථික බිඳවැටීමේ ප්‍රකාශනයක් හැටියට.

බඩුමිල වැඩි වුණාම එහි හරය තේරුම් නොගෙන ගැසට්වලින් පාලනය කරන්න හදන්නේ ඒ නිසා. හැබැයි ගැසට් එකේ මිලට බඩු ගන්න නැහැ. ගැටලුව වෙන්නේ බඩුමිල නම්, ගැසට් එකෙන් විසඳන්න පුළුවන්. නමුත් ගැටලුව බඩුමිල නොවන නිසා එය ගැසට්වලින් විසඳන්න බැහැ. ගිය අවුරුද්දේ හාල්වලට විතරක් ගැසට් 05ක් ගැහුවා. අවුරුද්දකට කන්න දෙකයි තිබෙන්නේ. ගැසට් එකෙන් හාල් මිල පාලනය කරන්න බැරි, මිල ඉහළ යාම ආර්ථික අර්බුදයේ ප්‍රකාශනයක් නිසයි. මාළුවා ගිලින්නේ පනුවා. හැබැයි ඇමිණෙන්නේ කොක්කේ. පනුවා කාපු නිසා මාළුවා මැරුණා නොවෙයි. කොක්ක නිසයි මාළුවා මැරෙන්නේ.

මේ නිසා ආර්ථිකයේ ඇතිවී තිබෙන අර්බුදය ගැන අපි සැලකිය යුතු අවධානයක් යොමු කළ යුතු වෙනවා. ආර්ථිකයේ මතුවී තිබෙන ප්‍රධානම ගැටලුව ණය අර්බුදයයි. රටක් හැටියට අපේ ණය ධාරිතාව ඔරොත්තු නොදෙන මට්ටමක තිබෙනවා. 2000 වසරේදී මුළු ණය ප්‍රමාණය බිලියන 1218යි. 2005 වෙනකොට බිලියන 2219යි. අවුරුදු 05කදී බිලියන 1008කින් ණය වැඩි වුණා. 2010 වෙන කොට බිලියන 4594 දක්වා වැඩිවුණා. 2015 වෙනකොට 8599ක්. 2019වෙන කොට බිලියන 6000කින් වැඩිවෙනවා. 2020 සහ 2021 අපේක්ෂා කරන ණය ගැනීම බිලියන 5872ක්. ඒකෙන් බිලියන 5800ක් විතර නැවත ණය ගෙවීමට. 2021අවසන් වන විට අපේ ණය පංගුව බිලියන 17300දක්වා ඉහළ යනවා.

2012 ඉඳන් අපේ ණය ගිණුම්ගත කිරීමට අලුත් ක්‍රමයක් හඳුන්වා දුන්නා. ආණ්ඩුවේ ණය වෙනමත් රාජ්‍ය ආයතන සතු ණය වෙනමත් ගිණුම්ගත කළා. උදාහරණයක් හැටියට හම්බන්තොට වරාය හදන්න ණය ගත්තේ වරාය අධිකාරිය. ඒ ණය රජයේ හැටියට නෙවෙයි වරාය අධිකාරියේ ණය හැටියට ගිණුම්ගත කළා. 2021 අවසන් වන විට රුපියල් බිලියන 17300ක ණය පංගුවට රාජ්‍ය ආයතනවල ණය ඇතුළත් වෙන්නේ නැහැ. මාර්ග සංවර්ධන අධිකාරියේ, එයාර් ලංකා එකේ, පෙට්‍රෝලියම් එකේ, විදුලි බලමණ්ඩලය ආදී රාජ්‍ය ආයතනවල ණය බිලියන 1300යි. 2021 ඉවර වෙනකොට රටේ මුළු ණය බිලියන 18600යි. ඒක පුද්ගල ණය පංගුව ලක්ෂ 09 ඉක්මවනවා.

1981දී ඒක පුද්ගල ණය පංගුව රු.4357/-යි. 2005දී 113,000යි. 2015 වෙනකොට 418,000යි. 2021දී 900,000 ඉක්ම වනවා. අපේ රටේ ආර්ථිකය, රජයේ ආදායම වගේ සාධක සලකා බලනකොට අපිට දරාගන්න බැරි ණය පංගුවක හිරවෙලා ඉන්නේ. කෙනෙක් හිතන්න පුළුවන් ඔය ණය ගෙවන්නේ අපේ පොකට් එකෙන් නෙවෙයි කියලා. නමුත් භාණ්ඩවලට බදු ගහලා, දඩ ගහලා, ලියාපදිංචි ගාස්තු විදිහට මහා භාණ්ඩාගාරයට අයකර ගන්නේ අපේ සල්ලි. ණය ගෙවන්නේ භාණ්ඩාගාරයට ලැබෙන බදු මුදලින්. 2020දී අපේක්ෂිත බදු ආදායම බිලියන 1,550ක්. නමුත් උපරිම වශයෙන් ලැබෙන්නේ රු.බිලියන 1,350යි. ණය පොලිය සහ ණය වාරික වශයෙන් 2020දී රුපියල් බිලියන 1,854ක් ගෙවන්න සිදුවුණා. ආසන්න වශයෙන් ගත්තොත් බිලියන 500ක් විතර අමතරව ණය ගන්න සිද්ධ වුණා, ණය වාරික සහ පොලිය ගෙවන්න විතරක්. අනෙක් සියලු වියදම් සඳහා ආණ්ඩුව ණය ගන්න ඕනෑ. රාජ්‍ය සේවකයන්ගේ වැටුප් සහ විශ්‍රාම් වැටුප් ගෙවන්න කෝටි 90,000ක් ඕනෑ. සෞඛ්‍ය සඳහා කෝටි 15,900ක්, ප්‍රවාහනය සඳහා කෝටි 4,100ක්, අධ්‍යාපනය සඳහා කෝටි 12,600ක්, ආදී සියළු වියදම්වලට ණය ගන්න වෙලා. අවුරුදු 73ක් අනුගමනය කළ ආර්ථික ප්‍රතිපත්තිය නිසා අපිට දරාගන්න බැරිතරම් ණයක් ගොඩගැහිලා. 2021 අපේක්ෂිත ආදායම බිලියන 1919යි. ණය පොලී වාරිකය ගෙවන්න බිලියන 2117ක් යනවා. භාණ්ඩාගාරයට ලැබෙන මුළු ධනයම ණය පොලී සහ වාරිකය ගෙවන්න ප්‍රමාණවත් නැහැ.




මේ තත්වය තුළ සෞඛ්‍ය සඳහා වියදම් කප්පාදු කරන්න වෙනවා. ඉස්පිරිතාලේ බෙහෙත් නැති වෙනවා. අධ්‍යාපනය සඳහා මුදල් කප්පාදු කරනවා. එතකොට පාසලේ නඩත්තු වියදම් දෙමාපියන් පිට පැටවෙනවා. ආණ්ඩුවේ සියලු ආදායම් ණය ගෙවීමට යොදවන තත්වයක් තුළ ජනතාවගේ සියලු සේවාවන් කප්පාදු කරනවා. 2020 අගෝස්තු වෙනකොට රජය මුළු ණය ප්‍රමාණය ට්‍රිලියන 14.3යි. මෙයින් 47%ක් වූ ඉහළ ප්‍රමාණයක් විදේශීය ණය වශයෙන් ලංකා ඉතිහාසයට එකතු වෙනවා. ආසන්න වශයෙන් ගත්තොත් ඩොලර් බිලියන 35.3ක්. විදේශ ණය ගිණුම්ගත කරන්න වෙන්නේ ඩොලර්වලින්. ඒවා ගෙවන්නත් ඩොලර් ඕනෑ. දේශීය ණය ගෙවන්න සල්ලි අච්චු ගහලා පුළුවන්. නමුත් විදේශීය ණය එහෙම ගෙවන්න බැහැ. අපිට ඩොලර් අච්චු ගහන්න බැහැ; උපයන්න ඕනෑ. ආණ්ඩුවේ ආයතන ඩොලර්වලින් විදේශ ණය ගන්නවා වගේම මේ රටේ පෞද්ගලික සමාගම් පවා ඩොලර්වලින් ණය අරන් තිබෙනවා. පෞද්ගලික අංශයෙන් ගත් ණයත් එකතු කළාම රටක් හැටියට අපේ විදේශ ණය ප්‍රමාණය ඩොලර් බිලියන 56යි. හැබැයි ආණ්ඩුවේ ණය පංගුව ඩොලර් බිලියන 35.5යි. එයින් හම්බන්තොට වරාය හදන්න ගියේ ඩොලර් බිලියන 1.1යි. තව විදිහකින් කියනවා නම් හම්බන්තොට වරාය වගේ 30ක් අපි විදේශයන්ට ණයයි. විදේශීය ණය පංගුවෙන් මේ අවුරුද්දේදී රටක් හැටියට ඩොලර් බිලියන 8.7ක් ගෙවන්න ඕනෑ. රජයේ ණය නෙවෙයි රටක් හැටියටයි මේ විදේශීය ණය පංගුව ගෙවන්න තියෙන්නේ. මේ තුළ ආණ්ඩුව, රාජ්‍ය ආයතන, සහ පෞද්ගලික අංශය ගෙවන්න ඕනෑ ඩොලර් ණය සියල්ලම ඇතුළත් වෙනවා.

ණය වාරික හැටියට ඩොලර් බිලියන 8.7ක් ගෙවීමට අමතරව විදේශ වෙළඳාමෙන් ඇතිවෙන පාඩුව පියවන්නත් ඩොලර් ඕනෑ. විදේශ වෙළඳාමේ හිඟය දළ වශයෙන් ඩොලර් බිලියන 09ක් විතර වෙනවා. මේ හිඟය පියවා ගන්න සියලුම ආනයන සීමා කර තිබෙනවා. මේ ආනයන සීමා කිරීම් නිසා රට ඇතුළේ වෙනත් අර්බුද රැසක් ඇති වූවත් උපරිම වශයෙන් විදේශ වෙළඳාමේ පාඩුව ඩොලර් බිලිය 06 දක්වා අඩුකර ගන්න පුළුවන්. ඊට වැඩිය අඩුකර ගන්න බැහැ. දැන් ලෝක වෙළඳපොළේ තෙල් මිල බැරල් එකක් ඩොලර් 70දක්වා ඉහළ ගිහින් තිබෙනවා. ඒ නිසා විදේශ වෙළඳාමේ පාඩුව නැවත ඉහළ යන්න පුළුවන්. කොහොම වුණත් රටක් හැටියට විදේශ ණය ගෙවන්න ඩොලර් බිලියන 8.7ක් ඕනෑ වගේම විදේශ වෙළඳාමේ පාඩුව පියවා ගන්න තවත් ඩොලර් බිලියන 06ක් විතර ඕනෑ. මේ නිසා ඩොලර් බිලියන 14.7ක අවශ්‍යතාවයක් තිබෙනවා.

විදේශීය සමාගම් අපේ රටේ විවිධ ආයෝජන සිදුකර තිබෙනවා. උදාහරණයක් හැටියට දුම්කොළ සමාගම ඔවුන් අපේ රටේ ව්‍යාපාර කරලා ලාභ ලබාගෙන ආපසු අරන් යනවා. ඒ ලාභ ගෙනයන්නේ ඩොලර්වලින්. ඒ වගේම කොටස් වෙළඳපොළේ විදේශීය සමාගම් ආයෝජනය කරනවා. ඔවුන් කොටස් ගනුදෙනුවලින් උපයා ගන්නා ලාභය ගෙනියන්නේත් ඩොලර් හැටියට. අයි.ඕ.සී. සමාගම තෙල් විකුණලා ලාභ ගෙනියන්නේත් ඩොලර්වලින්. මේ වගේ විවිධ විදේශ ආයෝජනවලින් ලබාගන්නා ලාභය ගෙනියන්නේ ඩොලර්වලින්. අපේ සමහර ආයෝජකයන් පිටරටවල ආයෝජනය කරන්න ගෙනියන්නේත් ඩොලර්වලින්. ඒ ආයෝජනවලින් ලබන ලාභය ලංකාවට ගේනවා. මේ සියල්ල තිබුණත් අපි පිටරට ආයෝජනය කරලා, ලබාගන්නා ලාභවලට වඩා පිටරට අය අපේ රට තුළින් ආයෝජන ප්‍රතිලාභ හැටියට ආසන්න වශයෙන් ඩොලර් බිලියන 2.4ක් ආපසු ගෙනියනවා. මේ මුදලත් 2021 වර්ෂයේදී ඩොලර් හැටියට පිටරටට ඇදී යනවා. මේ අවුරුද්ද තුළදී දළ වශයෙන් ඩොලර් බිලිය 17ක් විදේශීය ගෙවීම් සඳහා ඕනෑ. මේ මුදල හොයාගන්නේ කොහොමද? සල්ලි අච්චු ගහලා මේ වියදම් පියවන්න බැහැ. අතිරේක වශයෙන් ඩොලර් බිලියන 17ක වියදමක් තිබෙනවා.

මේ වියදම පියව ගන්න විදෙස්ගත ශ්‍රමිකයන් මෙහෙට සල්ලි එවනවා. ඒ වගේම පිටරට අය මෙහෙ වැඩකරලා සල්ලි එහෙට යවනවා. එතකොට ලංකාවේ ඩොලර් එහෙට යනවා. සාමාන්‍යයෙන් විදේශ රැකියා කරන අයගෙන් අපේ රටට ඩොලර් බිලියන 07ක් එනවා. මේ රටේ රැකියා කරන විදේශිකයන් වෙනුවෙන් ඩොලර් බිලියනයක් විතර ආපහු යනවා. එතනින් බිලියන 6ක් ඉතුරු වෙනවා. අවුරුද්දට අවශ්‍ය අර ඩොලර් බිලියන 17 පියවා ගන්න තව ඩොලර් බිලියන 11ක් ඕනෑ. සංචාරක ව්‍යාපාරයෙන් ආසන්න වශයෙන් බිලයන 2.8ක ලාභයක් තිබෙනවා. ඉතිරි හිඟය පියවන්න ඩොලර් හොයා ගන්නේ කොහොමද? ආණ්ඩුව හමුවේ තිබෙන මූලික ගැටලුව මේක.

ඩොලර් හොයාගන්න ආකාර තුනයි තිබෙන්නේ. විදේශීය වෙළඳපොළෙන් ණය ගන්න වෙනවා. ඒ වෙනුවෙන් කරන්න සිදුවෙලා තිබෙන්නේ රටේ සම්පත් විකිණීමයි. ණය කොන්දේසි වෙනුවට දැන් ඉදිරිපත් වෙන්නේ සම්පත් විකිණීමයි. උදාහරණයක් හැටියට, නැගෙනහිර ජැටිය වෙනුවට බරහිර ජැටිය අදානි සමාගමට විකුණන්න යන්නේ ඩොලර් බිලියනයක් ගන්න. චීනයට ගිහින් ණය ඉල්ලනකොට නයනතිව් දූපත්වල සුළං විදුලි බලාගාර ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව චීනයට ඉල්ලනවා. අපිව හිරකරලා. ණය වෙනුවට ජාතික සම්පත් විකිණීමට සිදුවීම යන දෙකම එකට ගැටගැහිලා.

ඊට අමතරව ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවලින් ණය ගන්න වෙනවා. 2009 ඉඳන් ස්වෛරීත්ව බැඳුම්කරවලින් ඩොලර් බිලියන 15.5ක් ණය අරන් තිබෙනවා. පසුගිය ඔක්තෝබර් මාසයේ එක බිලියනයක් ගෙව්වා. මේ විදිහට 2029 වනතුරු නිදහස් කරන්න ස්වෛරීත්ව බැඳුම්කර ණය තිබෙනවා. මේවායේ පොලිය 7.5.


11 වැනි පිටුවට

# චීනය දිළිඳුකම ජයගනියි



චීනය දුප්පත්කමට එරෙහි සටනින් 'සම්පූර්ණ ජයග්‍රහණයක්' අත්පත් කරගත් බව පෙබරවාරි 25වැනිදා එකී ජයග්‍රහණය සැමරීමේ හා දුප්පත්කමට එරෙහි සටනේ වීරවරුන්ට උපහාර පුද කිරීමේ උත්සවයේදී චීන ජනාධිපති ක්ෂී ජින්ග් පින් විසින් ප්‍රකාශ කරන ලදී. එක්සත් ජාතීන්ගේ සංවිධානය දරිද්‍රතාව තුරන් කිරීමේ වසර ලෙස නම් කර ඇත්තේ වසර 2030යි. මේ අනුව චීනය එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ඉලක්කයට වසර දහයකට පෙර, ලෝකයේ විශාලතම ජනගහනය සහිත රට තුළ දරිද්‍රතාව මුලිනුපුටා දමනු ලැබ තිබේ. මේ සමග චීනය තනි රටක් ලෙස ලෝක දරිද්‍රතාව 70%කින් අඩු කිරීමට දායක වී තිබේ. චීන කොමියුනිස්ට් පක්ෂය ආරම්භ කර වසර සියයක් පිරෙන 2021 වසර තුළ දී මෙකී ජයග්‍රහණය අත්පත් කර ගැනීම මෙහි ඇති තවත් විශේෂත්වයකි.

1990 වසර වන විට චීන ජනගහනයෙන් 36.2%ක්, එනම් බිලියන 1.9ක් දරිද්‍රතා රේඛාවෙන් පහළ ජීවත් වූහ. 2012 වසර වන විට එකී සංඛ්‍යාව මිලියන 98.99ක් විය. ඒ වන විට චීනයේ කවුන්ටීස් (කෝරළ) නමැති ප්‍රාදේශීය සභා මට්ටමේ ඒකක අතරින් 1/3ක් දරිද්‍රතා මට්ටමින් පහළ පැවති අතර ඒවායේ පමණක් මිලියන 80ක පමණ ජනතාවක් ජීවත් විය. චීනය 'දරිද්‍රතාව තුරන් කිරීමේ ඉලක්ක ගත වැඩපිළිවෙළ ආරම්භ කරන්නේ 2013 වසර අගදීය. එතැන් සිට පසුගිය අවුරුදු අටේදී චීනයේ වත්මන් නිල දරිද්‍රතා මට්ටමට වඩා පහළින් සිටි මිලියන 98.99ක ජනතාවක් දරිද්‍රතාවෙන් මුදාගෙන ඇති අතර රට තුළ දුගීභාවයෙන් පෙළුණු කවුන්ටීස් නමැති ප්‍රාදේශීය සභා මට්ටමේ ඒකක 832ක් හා ඊට අයත් වූ ගම්මාන 128,000ක් මෙලෙස දුගීභාවයෙන් මුදා ගනු ලැබ තිබේ.



*The national poverty line was set at an annual income of 2,300 yuan in 2010, and was adjusted for purchasing power parity (PPP).

එක්සත් ජාතීන්ගේ සංවිධානයට අනුව දරිද්‍රතා මට්ටම වන්නේ දිනකට ඩොලර් 1.9ක් හෝ ඊට අඩු ආදායමක් ඉපයීමය. 2010 වසරේ චීනයේ ජාතික දරිද්‍රතා මට්ටම වූයේ දිනකට යුවාන් 2300ක ආදායමකි. යුවාන් 2300ක් එක්සත් ජනපද ඩොලර් එකකට මදක් අඩු වුවද මිලදී ගැනීමේ හැකියාවට සාපේක්ෂව (PPP) සලකා බැලු කල චීනයේ ජාතික දරිද්‍රතා මට්ටම ගෝලීය දරිද්‍රතා මට්ටමට වඩා 20%කින් ඉහළ අගයක්, එනම් ඩොලර් 2.3කට සමාන අගයක් ලෙස සැලකේ. චීනයේ ජාතික දරිද්‍රතා මට්ටම 2020 වසරේදී දිනකට යුවාන් 4000ක් දක්වා ඉහළ දමන ලදී.

1978 වසරේදී ආරම්භ කරන ලද ආර්ථික ප්‍රතිසංස්කරණවලින් පසු චීනය දරිද්‍රතාවෙන් පෙළෙන ප්‍රදේශ හඳුනාගැනීම සඳහා රාජ්‍ය කවුන්සලයක් පිහිටුවන ලදී. ඉන්පසු චීන රජය විසින් නිල ජාතික දරිද්‍රතා රේඛාවක් ප්‍රකාශයට පත් කරනු ලැබිණ. දරිද්‍රතාව තුරන් කිරීම සඳහා විශේෂ අරමුදලක්ද පිහිටුවන ලදී. ඉන්පසු 1994දී දරිද්‍රතාව තුරන් කිරීම සඳහා සත් අවුරුදු සැලැස්මක් හඳුන්වා දෙනු ලැබීය. එහි ඉලක්කය වූයේ එකී අවුරුදු හත තුළ මිලියන 80ක ජනතාවක් දරිද්‍රතාවෙන් මුදවා ගැනීමයි. ඒ සඳහා රටෙහි වඩාත් නාගරික ප්‍රදේශ බටහිර ප්‍රදේශයන්හි ඇති දරිද්‍රතාවෙන් පෙළෙන ප්‍රදේශ ගොඩනැගීම සඳහා යොමු කරන ලදී.

දරිද්‍රතාව තුරන් කිරීමේ ඉලක්ක ගත වැඩපිළිවෙළ 2013 වසරේදී ආරම්භ කරමින් එහි ප්‍රථම පියවර වශයෙන් ගෙයින් ගෙට කරන ලද සමීක්ෂණයන්ට අනුව සැබෑ ලෙස උදවු අවශ්‍ය වන්නේ කාටද, උදවු සැලසිය යුත්තේ කවුරුන් විසින්ද, උදවු ලබා දිය යුත්තේ කවර ආකාරයටද, පවත්නා දරිද්‍රතාව තුරන් කිරීම සඳහා සකස් කළ යුත්තේ කුමන ක්‍රියා මාර්ගද, ඒ සඳහා කුමන ප්‍රමිතීන් පවත්වා ගත යුතුද, යන්න තීරණය කර දත්ත සංචිතයක් සාදනු ලැබිණ. ඒ සඳහා සහ දරිද්‍රතාව තුරන් කිරීමේ වැඩ සටහන් සඳහා කොමියුනිස්ට් පක්ෂ ක්‍රියාකාරිකයින් මිලියන 03කට ආසන්න ප්‍රමාණයක් රටේ දුප්පත්ම ප්‍රදේශවලට පිටත් කර හරින ලදී.

චීන කොමියුනිස්ට් පක්ෂය දරිද්‍රතාව තුරන් කිරීම යන්නෙන් අදහස් කරන ලද්දේ හුදු දෛනික ආදායම හෝ මාසික ආදායම ඉහළ දැමීම පමණක් නොවේ. ඔවුන් මෙහිදී ප්‍රධාන ගැටලු දෙකක් හඳුනා ගන්නා ලදී. එනම් ප්‍රමාණවත් තරම් අහාර පාන සහ ඇඳුම් පැළඳුම් ලබා දීමයි. ඒ අතරම අනිවාර්ය අධ්‍යාපනය, මුලික සෞඛ්‍ය හා වෛද්‍ය පහසුකම් සහ ආරක්ෂිත නිවාස ජනගහනයේ සියලු දෙනාට ලබා දීම සහතික කිරීමයි. පසුගිය අවුරුදු අට තුළ චීනයේ දුගී ප්‍රදේශවල මාර්ග කි.මී. මිලියන 1.1ක් තනා තිබේ. මිලියන 25.68ක ජනතාවකගේ නිවාස පහසුකම් වැඩි දියුණු කර තිබේ. මිලියන 7.9ක ජනතාවකට නව නිවාස ඉදිකර දී තිබේ. ජීවත් වීමට නුසුදුසු හා දුෂ්කර ප්‍රදේශවල ජීවත් වූ මිලියන 9.6ක ජනතාවක් එම ප්‍රදේශවලින් ඉවත් කර වඩා යහපත් ප්‍රදේශවල පදිංචි කරනු ලැබ තිබේ. පසුගිය අවුරුදු අට තුළ පමණක් දරිද්‍රතාවෙන් පෙළුන ගම්මානවලින් 98% කටම 4G අන්තර්ජාල පහසුකම් ලබා දී තිබේ.

චීන කොමියුනිස්ට් පක්ෂයට රට තුළ අන්ත දරිද්‍රතාව තුරන් කිරීමේ කටයුත්ත සරල හෝ පහසු දෙයක් වූයේ නැත. ඒ සඳහා සැලකිය යුතු කාලයක්, විශාල සම්පත් ප්‍රමාණයක් හා දැවැන්ත පරිශ්‍රමයක් යෙදීමට සිදුවිය. 2013 වසර අගදී දරිද්‍රතාව තුරන් කිරීමේ ඉලක්කගත වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීමෙන් පසු එම මෙහෙයුම තුළදී කොමියුනිස්ට් පක්ෂ ක්‍රියාකාරිකයින් 1800කට පමණ දිවි පිදීමට සිදු විය. ඒ අතරම කොවිඩ් 19 වසංගත තත්වයට මුහුණ දීමට සිදු විය. චීනයේ ක්‍රියාත්මක සමාජවාදී ක්‍රමය පිළිබඳ ගැටලු තිබුණද, චීනය ජාත්‍යන්තර ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ බරපතළ ගැටලු තිබුණද චීනය මේ ලබාගත් ජයග්‍රහණය සුළුපටු නොවේ. එය සැබෑ ජයග්‍රහණයකි.

## ප්‍රංශය: පැරිස් කොමියුනය සමරමින්




2021 මාර්තු 18 වන දිනට පැරිස් කොමියුනය පිහිටුවා වසර 150ක් සපිරුණි. ලෝකයේ ප්‍රථම නිර්ධන පංති රාජ්‍යය වූ එය ඉන් දින 72කට පසුව ජර්මනු ධනපති පංතියේ ආධාරය ලබා ගත් ප්‍රංශ ධනපති පංතිය විසින් බිඳ හෙළන ලදී. ලොව පුරා නිර්ධන පංතික ව්‍යාපාරය පැරිස් කොමියුනයේ 150වැනි සංවත්සරය සැමරූ අතර මෙම ඡායාරූපයේ දැක්වෙන්නේ ප්‍රංශයේ පැවති පැරිස් කොමියුන සමරු අවස්ථාවකි.

## එක්සත් ජනපදය: කොවිඩ් එන්නතත් ධනවාදයේ අයිතියට




peoples dispatch අන්තර් ජාල සඟරාව වාර්තා කරන ආකාරයට එක්සත් ජනපදය ඔවුන්ගේ mRNA කොවිඩ් 19 එන්නත් වන Moderna සහ Pfizer එන්නත් තමන්ගේ රට තුළ සියලු ජනතාව එන්නත්කරණය කරන තුරු අනෙකුත් රටවලට ලබා නොදීමට තීරණය කර තිබේ. ඔවුන් එකී එන්නත් දෙක ඊට පෙර ලබා දීමට බලාපොරොත්තු වන්නේ ඊශ්‍රායලයට හා යුරෝපයේ තමන්ට හිතවත් රටවල් කිහිපයකට පමණි. එසේම මෙම එන්නත් ඉතාම අඩු උෂ්ණත්වයක ගබඩා කළ යුතු බැවින් හා ඒ සඳහා විශාල වියදමක් දැරීමට සිදුවන බැවින් ආසියාවේ, අප්‍රිකාවේ, හා ලතින් ඇමෙරිකාවේ දුප්පත් රටවලට එය මිලදී ගැනීමට නොහැකි වී තිබේ. මේ අතර ඉන්දියාව හා දකුණු අප්‍රිකාව කොවිඩ් එන්නත් නිෂ්පාදනය සඳහා පමණක් ලෝක වෙළඳ සංවිධානය විසින් ක්‍රියාත්මක කර ඇති බුද්ධිමය දේපළ අයිතිය තාවකාලිකව ඉවත් කර තම රටවල් තුළ දී එකී එන්නත් නිෂ්පාදනයට අවසර දෙන ලෙස කරන ලද ඉල්ලීමටද එක්සත් ජනපදය, බ්‍රිතාන්‍යය, යුරෝපා සංගමය, හා ඕස්ට්‍රේලියාව විරුද්ධ වී තිබේ.

## එක්සත් ජනපදය: කොවිඩ් වසංගත පාලනයට අසමත්ව



මාර්තු 24 වන දා වන විට එක්සත් ජනපදය තුළින් වාර්තා වූ කොවිඩ් 19 රෝගීන් සංඛ්‍යාව මිලියන 30 අබිබවා ගියේය. එසේම එරටින් වාර්තා වූ කොවිඩ් 19 මරණ සංඛ්‍යාව 545,000 ඉක්මවා ගියේය. ලෝක ජනගහනයෙන් 5%ක් පමණ වෙසෙන එක්සත් ජනපදය තුළ ලෝකයේ මෙතෙක් වාර්තා වූ කොවිඩ් 19 රෝගීන්ගෙන් 25%ක් වාර්තා වීමත් ලෝකයේ සිදුවූ සමස්ත කොවිඩ් 19 මරණ සංඛ්‍යාවෙන් 20%ක් වාර්තා වීමත් ධනවාදයේ අසාර්ථකභාවය හොඳින්ම පෙන්වා දෙන සාක්ෂියක් බවට පත්ව තිබේ. මේ වන විට එක්සත් ජනපදයේ වැඩිහිටි ජනගහනයෙන් මිලියන 45කට මුළුමනින්ම කොවිඩ් 19 එන්නත ලබා දී ඇති අතර මිලියන 84ක් අර්ධ වශයෙන් එන්නත් කරනු ලැබ තිබේ. එසේ වුවත් එරට කොවිඩ් 19 වසංගතයේ ව්‍යාප්තිය පාලනය කර ගැනීමට ඔවුහු අසමත් වී සිටිති.

## ඉන්දියාව: පෞද්ගලීකරණයට එරෙහිව බැංකු සේවකයින් වීදි බැස



මිලියනයකට අධික ඉන්දියාවේ රාජ්‍ය බැංකු සේවකයෝ පසුගිය මාර්තු 15 හා 16 යන දෙදින වැඩ වර්ජනයක නිරත වූහ. නරේන්ද්‍ර මෝදි ආණ්ඩුව විසින් රාජ්‍ය බැංකු පෞද්ගලීකරණය කිරීමට ගන්නා උත්සාහයට විරෝධය පළ කරමින් වැඩ වර්ජනයේ යෙදුනු ඔවුහු නගර ගණනාවකදීම බැංකු පෞද්ගලීකරණයට එරෙහිව විරෝධතාවන්හි යෙදුනහ.

# ඩොලර් අර්බුදය හමුවේ මූල්‍ය අරමුදලට අත වැනීම!

ලංකාව අද වන විට මුහුණ දෙන අර්බුදයන් අතර ප්‍රධානම අර්බුදය ලෙස ණය අර්බුදය ඉදිරියට පැමිණ ඇත. ඩොලරය කඩා වැටීම, බඩු මිල ඉහළ යාම, කොටස් වෙළඳපොළේ සිදුවන සීඝ්‍ර විපර්යාස, ආනයන සීමා කිරීම්, මුදල් අච්චු ගැසීම, ආණ්ඩුවේ හදිසි ගැසට් නිවේදන මගින් බදු වෙනස් කිරීම් මේ සියල්ල ගොඩ ඒමක් නැති ණය අර්බුදයේ ප්‍රකාශනයන්ය.

2017 දී ට්‍රිලියන 14.3 ක් වූ මුළු රාජ්‍ය ණය කන්ද 2021 අවසානයේදී ට්‍රිලියන 18.7 ක් (බිලියන 18,700ක්) වනු ඇතැයි ගණනය කර ඇත. මෙම බිලියන 18.7 න් 47% පංගුවක් වනු ඇත්තේ විදේශ ණය (ඩොලර් ණය) ලෙස ලබාගෙන ඇති ණයයි. ආණ්ඩුව රුපියල්වලින් ගෙවිය යුතු ණය වෙනුවෙන් තාවකාලික පැලැස්තර උපක්‍රමය ලෙස භාවිතා කරන්නේ මුදල් අච්චු ගැසීමයි. එමගින් ජනතාවට පීඩාකාරී, එහෙත් ආණ්ඩුව අර්බුදය ඉදිරියට තල්ලුකර ගැනීමේ ඉඩ සලසා ගනී. එය රට තුළ ඇති අර්බුදයට තාවකාලික පිළියමක් වුවත්, විදේශ ණය ගෙවීමට ඇති නොහැකියාවට විසඳුමක් නොවේ. ආණ්ඩුවට ඩොලර් අච්චු ගැසීමට හැකියාවක් නැත. වර්තමානය වන විට ඩොලර් ණය ලබා ගැනීමටද ආණ්ඩුවට ඇති මාර්ග බොහොමයක් ඇහිරෙමින් අර්බුදයේ කර මුලටම හිරවන මට්ටමට පත්ව ඇත.

## දේශීය අර්බුදයේ තරම

2020 වසරේ ආණ්ඩුවේ ආදායම ගණනය කරන ලද්දේ රුපියල් බිලියන 1588 ක් ලෙසිනි. නමුත්, අගෝස්තු වන විටත් ආදායම ලෙස එකතු කරගත හැකි වූයේ බිලියන 906 කි. මේ වන විට වාර්තා වන පරිදි 2020 වසර අවසානයේ ආණ්ඩුවේ ආදායම අපේක්ෂිත ප්‍රමාණයට වඩා බිලියන 500 ක් අඩුවෙන් එනම් බිලියන 1350ක් පමණ වනු ඇත. නමුත් 2020ට පමණක් ණය හා පොලී වාරික ලෙස ගෙවිය යුතු ප්‍රමාණය රුපියල් බිලියන 1754 කි. ණය වාරික හා පොලිය ගෙවීමටත් ආණ්ඩුවේ සමස්ත ආදායම මදිවන විට දෛනික කටයුතු පවත්වා ගැනීමට අවශ්‍ය අරමුදල් සපයා ගැනීම ආණ්ඩුව මුහුණදෙන ප්‍රධාන අර්බුදයයි. අධ්‍යාපනය, සෞඛ්‍ය, ප්‍රවාහනය, සමෘද්ධි සහනාධාර හා රජයේ පඩිනඩි හා විශ්‍රාම වැටුප් ගෙවීමට ආදී කටයුතුවලට පමණක් ආසන්න ලෙස බිලියන 2000ක් පමණ අවශ්‍යය. එක්කෝ ණය ගෙවිය යුතුය. නැති නම් දෛනිකව රට පවත්වා ගෙනයා යුතුය. ආණ්ඩුවට දෙකම කිරීමට ප්‍රමාණවත් මුදල් ඇත්තේ නැත. 2021ද තත්වය මෙයමය. ආදායම බිලියන 1919ක් අපේක්ෂා කරන විට ණය වාරිකය හා පොලිය ගෙවීමට පමණක් රු. බිලියන 2,117 ක් අවශ්‍යයය. ආණ්ඩුවත් ජනාධිපතිවරයාත් ගමට බැස කවර මාධ්‍ය සංදර්ශන පැවත් මුහුණදී ඇති අර්බුදයේ යථාර්ථය වැසිය නොහැකිය.

## විදේශ ණය පංගුව

කලින් සඳහන් කළ පරිදි ආණ්ඩුවේ මුළු ණය වාරික හා පොලී ගෙවීම්වලින් වැඩිම පංගුව විදේශ ණය පංගුවයි. එය මුළු ගෙවිය යුතු ණයවලින් 47% කි. මෙම ප්‍රමාණය ආසන්න ලෙස ඩොලර් බිලියන 56ක් පමණ වනු ඇත. එයින් ඩොලර් බිලියන 35.5 ක් පමණ රජය සෘජු ලෙස ලබාගෙන ඇති ඩොලර් ණය වන අතර ඉතිරි ඩොලර් බිලියන 20.5 ක් පමණ රජය වෙනුවෙන් වරාය, ගුවන් තොටුපළ, විදුලිබල මණ්ඩලය වැනි රාජ්‍ය ආයතන හා ව්‍යාපෘති වෙත ලබාගෙන ඇති ණය වේ. මීට අමතරව පෞද්ගලික අංශය ලබාගෙන ඇති ණයද ගෙවිය යුත්තේ විදේශ වත්කම්වලින් බැවින් එම ප්‍රමාණයද මෙහි අඩංගුය.



මෙම මුළු ඩොලර් ණය තොගයෙන් 2021/2022 වසර තුළ (2021 ජනවාරි සිට 2022 ජනවාරි දක්වා) ආණ්ඩුව ගෙවිය යුතු මුළු ණය වාරිකය ඩොලර් බිලියන 8.4 කි. (මිලියන 8400 කි.) මෙම ණය තුළ සාමාන්‍ය ලෙස වාරික ගෙවිය යුතු ඩොලර් බිලියන 6.4 ක්ද, කෙටි කාලීන ණය පහසුකම් ලෙස ලබාගෙන ඇති ඩොලර් මිලියන 1.3 ක් ද මෙම වසරේ ගෙවිය යුතු තාවකාලික ණය (Repo) රෙපෝ බිලියන 1ක්ද වශයෙන් ඇතුළත්ය.

## වත්කම් සංචිත හිඟය

අර්බුදය පැන නගින්නේ, මෙම වසර අවසාන වන විට ගෙවීමට ඇති ඩොලර් ණය වාරිකය ඩොලර් බිලියන 8.4 ක් වන විට භාණ්ඩාගාරයේ විදේශ වත්කම් සංචිත ලෙස එම ප්‍රමාණයටත් වඩා දෙගුණයකට අඩු මට්ටමට ඩොලර් සංචිත හිඟයකට වැටී තිබීමයි.

2020 මුලදී විදෙස් වත්කම් ලෙස ඩොලර් බිලියන 7.3 ක්ව පැවැති විදෙස් වත්කම් සංචිත ප්‍රමාණය මේ වන විට (2020 මාර්ත 5 වන විට) ඩොලර් බිලියන 4.5 ක් දක්වා පහත වැටී ඇත. එසේ අඩුවීමට ප්‍රධාන වශයෙන් බලපෑවේ 2010 දී ලබාගෙන තිබූ ස්වෛරීත්ව බැඳුම්කර ණයක් කල්පිරීම නිසා ඩොලර් බිලියනයක් විදේශ වත්කම්වලින් එකවර ගෙවීමට සිදුවීම හා ඉන්දියාව ලබාදී තිබූ සහන ණය ඩොලර් 400ක් වරාය ගැටලුව හේතුවෙන් අහෝසි කිරීම සමග එකවර ගෙවීමට සිදුවීමත්ය. මීට අමතරව මේ තරම් විදෙස් වත්කම් අඩුවීමට ප්‍රධාන ලෙස බලපාන ලද කරුණු අතර කොටස් වෙළඳපොළේ ආයෝජනය කරන ලද විදෙස් ආයෝජකයින් ලංකාවේ පවතින ආර්ථික පසුබිම හමුවේ තම කොටස් අඩු මිලට විකුණා මුදල් ආපසු රැගෙන යාමද බලපෑ කරුණකි.

## ගෙවුම්ශේෂ අර්බුදය

ලංකාවේ ඩොලර් හිඟයට බලපාන ප්‍රධාන හේතු අතර, ආනයන වියදම අපනයන ආදායම මෙන් දෙගුණයක පරතරයක් පැවැතීම ප්‍රධාන කරුණකි. මේ නිසා සාමාන්‍යයෙන් ඩොලර් බිලියන 10 ක් පමණ අමතර වියදමක් දැරීමට වාර්ෂිකව රටට ඩොලර් අවශ්‍යය. අපනයන ආදායම ඩොලර් මිලියන 10,000ක් වන විට සාමාන්‍ය තත්වය යටතේ ආනයන වියදම ඩොලර් මිලියන 20,000 ක් පමණ වේ. ධනවාදය කරපින්නා ගෙන අප විවෘත ආර්ථික මොඩලය අපට රටක් ලෙස ලබාදී ඇති "දායාදයේ" තරම එපරිදිය.

1977 න් පසු හුරුකරන ලද අධි පරිභෝජනවාදී වියදම් රටාව සහ නිෂ්පාදන ආර්ථිකය බිඳවැට්ටවීමේ සෘජු ප්‍රතිඵල ලෙස අපනයන ආදායම බිඳවැටීම මේ සඳහා බලපෑ සාධකයන්ය. ආණ්ඩුව 2020 වසරේදී අනුගමනය කරන ලද ආනයන සීමා කිරීම මගින් සහ ඩොලර් පිටට ගලායාම පාලනය කිරීමට දරන ලද උපක්‍රමික උත්සාහයන් මගින් යම් ප්‍රමාණයකට මෙම පරතරය පාලනය කළද එය 2021 දී ඒ පරිදිම ප්‍රතිඵල ගෙන ඒ යැයි සැක සහිතය.

2020 දී කොරෝන තත්වය ප්‍රබල ලෙස ලෝක පරිමාණවම වර්ධනයවීම නිසා ප්‍රවාහන කටයුතු පොදුවේ ඇනහිටීම නිසා ලෝක වෙළඳ පොළේ තෙල් මිල සීග්‍ර ලෙස අඩුවීමට ලක් විය. ඒ නිසා ලංකාවටද කලින් වසරවලට වඩා ඩොලර් බිලියන 1.3 ක පමණ ඉන්ධනවලින් ඉතිරි කර ගැනීමක් සිදුකර ගැනීමට හැකි විය. නමුත් අපනයන ආදායම්වල සෘජු වර්ධනයක් නොමැති තත්වය යටතේ 2020දී මෙම ආනයන අපනයන පරතරය උපරිම ලෙස අඩුකර ගත්තද තවත් ඩොලර් මිලියන 6 ක් පමණ ආනයන වියදම සඳහා අමතරව 2021 දී ආණ්ඩුව සපයා ගත යුතුව ඇත.

## විනිමය අහේනිය!

2021 වසර අවසානයට අනිකුත් විශේෂ ඉදිකිරීම් ව්‍යාපෘති ගැන නොසලකා ගණනය කළද, ණය වාරිකය හා පොලිය ගෙවීමට ඩොලර් බිලියන 8 ක්ද ආනයන සඳහා අමතරව ඩොලර් බිලියන 6 ක්ද වශයෙන් ඩොලර් බිලියන 15.4 ක් ආණ්ඩුව විසින් සපයාගත යුතුව ඇත.

නමුත් ඒ සඳහා 2021 දී ආණ්ඩුව ඇති ක්‍රියාමාර්ග කවරේද? ගෝඨාභය රාජපක්ෂ පාලනයට රට තුළ 2/3 බලයක් සහිත ආණ්ඩුවක් පැවැතීම හෝ 20 වැනි සංශෝධනය සම්මත කරගෙන තිබීම ඊට ප්‍රමාණවත් නොවේ. ජනාධිපතිවරයා ගම සමග පිළිසඳරට ගොස් තමන්ගේ දුක්ගැනවිලි ගමේ මිනිසුන්ට කීමෙන්ද මේ වසර තුළ ඩොලර් බිලියන 15.4 ක සපයා ගැනීමට නොහැකිය. ආණ්ඩුව කොහෙන් හෝ ඩොලර් තොග යක් සපයාගත යුතුමය. එය ඩේසි ආච්චිගේ මැණික් මල්ල රාජපක්ෂවරුන්ට පහළ වූවාසේ රටේ ණය අර්බුදය පහළ නොවන බව නම් පැහැදිලිය. ආණ්ඩුව වසරකට වැඩි කාලයක් අනුගමනය කළ තෝරාගත් භාණ්ඩ කිහිපයක් ආනයනය කිරීම පාලනය කිරීමය. ඒ සඳහා ටයිල් ගෙන්වීම පාලනය කළේය. ආණ්ඩුවේම ඇමතිවරුන් විවිධ කොමිස් ගනුදෙනු සඳහා ඒ වෙනුවෙන් තිබූ ගැසට් නිවේදන වෙනස් කළේය. වාහන අමතර කොටස් ගෙන්වීම පාලනය කළේය. එය තවදුරටත් කළ නොහැකි මට්ටමේ අර්බුද රැසක් දැන් නිර්මාණය කර හමාරය.

මීට අමතරව ඩොලර් ගිණුම පාලනය කරන ගනුදෙනුවලින් 25% ක් මහා බැංකුවේ තැන්පත් කිරීමටද පෞද්ගලික බැංකුවල ගනුදෙනුකරුවන්ගේ ගනුදෙනුවලින් 10%ක් මහා බැංකුවට යැවීමටද චක්‍රලේඛ පණවන ලද්දේ මෙම ඩොලර් අර්බුදයට විසඳුම් ලෙසිනි. ඒ සියලු ක්‍රියාමාර්ග දේශීය වෙළඳපොළේ ණය අර්බුදයට උත්තර ලෙස මුදල් අච්චු ගැසීම තරම් සාර්ථක ප්‍රතිඵල ගෙනදෙන්නේ නැත. ඒ බව හොඳින්ම ඔප්පුවී ඇත්තේ මේ සියලුම උපක්‍රම යොදා තිබියදීත් ඩොලරයේ හුවමාරු වටිනාකම රු.200 ඉක්මවා යාම විසින්ය. ඩොලරයට සාපේක්ෂව රුපියල කඩා වැටීම නැවත දේශීය වෙළඳපොළේ භාණ්ඩ මිල ඉහළ යාමටත් ලබාගෙන ඇති ණය සඳහා ගෙවිය යුතු රුපියල් වටිනාකම වැඩිවීමටත් සෘජුවම බලපාන බැවින් අර්බුදය තවත් වටයකින් බරපතළ වනු ඇත.

## ණය මාර්ග සහ IMF


මෙම අවදානම් සහගත අර්බුද මොහොතේදී ආණ්ඩුවට කෙටිකාලීනව ඉතිරිව ඇත්තේද ඉක්මනින් තවත් ණය සඳහා "මිතුරන්" සොයා ගැනීමය. නමුත් ඒ සඳහා ඇති ප්‍රධාන මාර්ග බොහොමයක් දැන් ආණ්ඩුව විසින්ම අහුරාගෙන හමාරය. ජාත්‍යන්තර වශයෙන් ආණ්ඩුව චීනය හා ඉන්දියාවේ පමණක් දඬු අඬුවට හිරවුණු දේශපාලනයක නියැලෙන තත්වය යටතේ අනිකුත් රටවල් ද්විපාර්ශවික ණය පහසුකම් සඳහා මේ මොහොතේදී පෙළඹේ යැයි සිතීමට නොහැකිය.

ඊළඟට ආණ්ඩුවට ණය සඳහා ඇති තවත් දොරටුවක් වන්නේ ජාත්‍යන්තර වෙළඳපොළේ ණය සඳහා බැඳුම්කර අලෙවියට ඉදිරිපත් වීමයි. නමුත් ලංකාව ණය ගෙවීමට නොහැකි රටක් ලෙස වර්ගීකරණයේ ඇති අසීරු මට්ටම අනුව ඉහළ පොලියක් යෝජනා කර ලංසු ඉදිරිපත් කළද ලංකාවේ බැඳුම්කර මිලදී ගැනීමට ඉදිරිපත් වන්නන් සොයා ගැනීම අසීරු වී ඇත. අලෙවි වුවද එම බැඳුම්කර ඉතා ඉක්මනින් යළි කල්පිරෙන ඒවා නිසා එයද තවත් අර්බුදයක්ම නිර්මාණය කරයි. උදාහරණ ලෙස 2020 දී කල් පිරෙන ලෙස 5.75% ක ඉහළ පොලී අනුපාතයක් යෝජනා කර ඩොලර් 100 ක් සඳහා නිකුත් කළ බැඳුම්කරයක ගැනුම් මිල ලෙස ඉදිරිපත් වී ඇත්තේ ඩොලර් 74.25 කි. ඒ ගනුදෙනුව අනුව අප රටක් ලෙස 2020 දී ඩොලර් 100 ක් පොලියද සමග ගෙවීමට අද ලබාගත හැක්කේ ඩොලර් 74.00ක් පමණි. නමුත්, මෙම වෙළඳපොළේම කොරියාවේ ඩොලර් 100 ක බැඳුම්කරයක් අලෙවි වන්නේ 106ක අධි මිලකටය. ඔවුන් ඒ සඳහා ගෙවනුයේ 2.5%ක කුඩා පොලියක් වුවද ඔවුන්ගේ ආර්ථිකයේ ස්ථාවරභාවය අනුව ඉල්ලුම ඉහළය. ඒ සැසඳීමෙන්ම ලංකාව ජාත්‍යන්තර බැඳුම්කර වෙළඳපොළේද වැටී ඇති අසීරු මට්ටම වටහාගත හැකිය.

ආණ්ඩුව චීනය විසින් ඉන්දියාව ලබාදුන් ආකාරයේම අතමාරු ණයක් (සහන ක්‍රමයේ ඇපකරයක්) ලෙස ඩොලර් බිලියන 1.5 ක් වටිනා චීන යුවාන් ණයක් ලැබිණි. මෙය තවත් ඩොලර් බිලියන 1.5 කින් අත්මාරුවක් ලබා ගැනීමක් මිස අඩු තරමේ සෘජු ණයක් ලැබීමක් නොවේ. මෙම SWPT ණය මගින් ලංකාවට චීනයෙන් පමණක් රුපියල්වලට බඩු ගැනීමෙන් චීනයට යුවාන්වලින් ලංකාවට ගෙවීමටත් පමණක් හැකි වේ. නමුත් එය මේ මොහොතේ ආණ්ඩුවට මහත් අස්වැසිල්ලක් වූ බව මාධ්‍ය ඊට ලබාදුන් ඉහළ ප්‍රචාරයෙන් පෙනී යයි.

73 වසරක ධනවාදී පාලනයේ තර්කානුකූල ප්‍රතිඵලය වී ඇත්තේ, රටට ජනතාවට දරාගත නොහැකි ණය උගුලක රට හිර කිරීම වගේම, කවර පාලනයකට වුවද මේ පවතින ප්‍රතිපත්තිම අනුගමනය කරන්නේ නම් ඉන් ජනතාවට ගැලවීම වෙනුවට තව තවත් එම උගුලේම හිරවීමට සිදුවන බව මේ වසරක කෙටි පාලනයෙන් ගෝඨාභය රාජපක්ෂද ඔප්පුකර හමාරය.

එක්කෝ දැනටත් විකුණා ඉතිරිව ඇති වරාය ඉතිරි කොටස්, ගුවන් තොටුපලවල්, තෙල් ටැංකි, ඛනිජ නිධි, වනාන්තර ඇතුළු ඉඩම් සහ කොළඹ ඇතුළු ප්‍රධාන නගරවල ආර්ථික මර්මස්ථාන කුණු කොල්ලයට තම කොමිස් කුට්ටි වෙනුවෙන් චීනය, ඉන්දියාව වැනි රටවල් කිහිපයක ප්‍රාග්ධනයට ගොදුරු කිරීම හෝ නැතිනම්, ජනතාව තවත් පීඩාවට පත්කරන ණය කොන්දේසි තොගයක් වෙනුවෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ණය උගුලකට රට හිර කිරීම හැර වෙනත් කිසිදු විකල්ප ආර්ථික යෝජනාවක් මේ ඩොලර් අර්බුදය හමුවේ වත්මන් පාලකයින්ට නොමැත. එය රාජපක්ෂ පාලනයට පමණක් නොව මේ පන්නයේ නව ලිබරල් ධනවාදී පැරණි ආර්ථික ප්‍රතිපත්තියම කරගසාගෙන යන කවර පාලනයකින් ප්‍රතිඵලය බව තේරුම් ගැනීම වඩා නිවැරදි දේශපාලන ආර්ථික පරිවර්තනයක් වෙනුවෙන් මේ මොහොතේදී අත්‍යාවශ්‍යය.



"දියුණු බලවේග ප්‍රතිගාමී බලවේගවලට විරුද්ධව කැරලි ගසන විට, කැරලි ගැසීම ඉතා අනර්ඝ දෙයකි. විප්ලවවාදී අංශය අවස්ථාවාදී අංශයට විරුද්ධව කැරලි ගැසීම හොඳ දෙයකි. එහෙත් අවස්ථාවාදී අංශය විප්ලවවාදී අංශයට විරුද්ධව නැගීසිටීම අයහපත් දෙයකි."

**ලෙනින්,**
**තෝ: කෘ: 2වෙළුම**
**226 පිටුව**



# විසඳුම තිබෙන්නේ සමාජ ක්‍රමය වෙනස් කිරීම තුළයි

## යූ.ඒ. නන්දසීලී සහෝදරිය - 71 ක්‍රියාකාරිනී

71 අරගලයට දායක වුණ සහෝදරියෝ කාටවත් පෞද්ගලික අරමුණු තිබුණෙ නැහැ. තිබුණෙ පොදු අරමුණක්. ඒ මේ සමාජ ක්‍රමය වෙනස් කරන එකයි. මේ අරගලයට සම්බන්ධ වෙනකොට අපිට බයක් දැනුනෙ නැහැ. අපට මොන වගේ අනතුරකට ලක් වෙන්න වෙයිද මැරෙයිද අත්අඩංගුවට පත් වෙයිද වගේ බයක් අපට ඇති වුණේ නැහැ. අපිට තිබුණ එකම අරමුණ මේ සමාජ ක්‍රමය වෙනස් කරන එක විතරමයි. ඒ වෙනුවෙන් එදා අපේ සහෝදරියන් ජීවිත පරිත්‍යාග කළා. සිරගෙවල්වල දුක්වින්දා. වධ බන්ධනයන්ට ලක්වුණා. එහෙම වෙලත් නැවතත් දේශපාලනය කරන්න තරම් හයියක් තිබුණ සහෝදරියෝ 71 අරගලය තුළ හිටියා.

එදාට සාපේක්ෂව ගත්තම අද මේ සමාජ ප්‍රශ්න, පීඩනය, අසාධාරණය දොරේ ගලලා. එදාට වඩා උග්‍ර විදිහට අපිට මේ පීඩනය දැනෙනවා. නමුත් මාධ්‍ය හා වෙනත් උපක්‍රම පාවිච්චි කරලා මේ හැමදේම යට යවනවා. කාන්තාවන් මිථ්‍යාවෙන් මුලා කරනවා. සත්‍යය වෙනුවට මිථ්‍යාව පසුපස හඹා යන කාන්තාවන් වැඩි පිරිසක් තමයි අද දකින්න ලැබෙන්නේ. නමුත් අපි ඔවුන්ට ආරාධනා කරනවා, මේ සමාජ අසාධාරණයට එරෙහිව නැගී සිටින්න; මිථ්‍යාවෙන් මිදිලා ලෝකය දකින්න. අපි ඔබට නායකත්වය දෙන්න සූදානම්. සමස්ථ කාන්තා පරපුරටම නායකත්වය දෙන්න, මඟ පෙන්වන්න ජනතා විමුක්ති පෙරමුණ එදත් අදත් සූදානම්. අපි හැමෝම එකතු වෙලා අපිට ජීවත්වෙන්න පුළුවන් යහපත්, සාධාරණ සමාජයක් ගොඩ නගමු. අපි මෙතෙක් කළේ ආණ්ඩු මාරු කරපු එක. නමුත් සමාජ ක්‍රමය වෙනස් කිරීම තුළ තමයි විසඳුම තියෙන්නේ කියන එක කාන්තාවන් වටහා ගත යුතුයි.

# ඉතිහාසය... කියවා ගැනීමට පමණක් නොවේ



ඉතිහාසය, එලෙසින්ම ප්‍රතිනිර්මාණය කළ නොහැක. නමුත් ඉතිහාසය ඇසුරු කොට ගෙන අනාගතය වඩාත් හොඳින් ලිවිය හැකිය. 71 අරගලයද එවැනි පූර්වාදර්ශයන් සපයන අපූරු තක්සලාවකි. විශේෂයෙන් කාන්තාවන් වන අපට අප ගැනම නැවත සිතා බලන්නට බල කරන, පොළඹවන අපූරු ආදර්ශයකි.

වර්තමාන කාන්තාවන්ගේ ඉරණම කෙබඳුද? නව ලිබරල් ධනවාදී ආර්ථිකය තුළ කාන්තාව නොවැළැක්විය හැකි ලෙස වෙළඳ භාණ්ඩයක් බවට පත්වී ඇත. තමන් විකිණෙන අතරම නොදැනීම ඇය හොඳ මිලදී ගන්නියකද වී තිබේ. මාධ්‍ය හා වෙනත් ප්‍රචාරණ උපක්‍රම මගින් කාන්තාවන් වෙළඳ රාමුවක සිරගත කරන්නට පවත්නා ආර්ථික ක්‍රමය සමත් වී තිබේ. ඒ රාමුව තුළ කාන්තාවන් සතුටු කරන විලාසිතා, රූපලාවන්‍ය ආදී මෙවලම් ඕනෑ තරම් තිබෙනු දැකිය හැක. සුපවේදය තුළ ගැබ්ව ඇත්තේ නිරෝගී බව අමතක කරවන තරම් රසයකි. මේ අපූරු විජ්ජාව තුළ දැස් නිලංකාර වනු මිස එතැනින් එපිට ලොවක් දැකීමේ අවශ්‍යතාවක් කාන්තාවන්ට ඇති නොවේ.

ධනවාදී මාධ්‍ය උත්සාහ කරමින් සිටින්නේ මෙම මායාමය වෙළඳ ලෝකයට හරි හරියට සමකළ හැකි මිථ්‍යා ලෝකයක්ද කාන්තාවන් සතු කිරීමටය. රූපවාහිනිය, ගුවන් විදුලිය, පුවත්පත් මෙන්ම සමාජ මාධ්‍ය විසින් ද, විවිධ වෙළඳ සමාගම්ද මේ මිථ්‍යාවන්ගේ නිර්මාතෘවරු වෙති. ඉදින් වෙන ලොවක් අවශ්‍ය නැතැයි ඔවුහු ගැහැනුන්ගේ චින්තනයටම කාවද්දීමට තැත් කරති. මේ මිථ්‍යාවන් හා වෙළඳ ලෝකය තුළ අතරමං වෙන බොහෝ කාන්තාවන් සැබෑ ජීවිතයක අත්දැකීම සිහිනයක් සේ සැලකීම පුදුමයට කරුණක් නොවේ.


අපි 71 අරගලයෙන් පාඩම් උගත යුත්තේ මෙවන් සමාජ වටපිටාවක් වෙනස් කිරීමේ දුෂ්කර කාර්යය ඉටුකරනු පිණිසය. වර්තමානයේ දැකිය හැක්කේ. 1971 වසරේ තිබූ සමාජ වටපිටාව වඩා හාත්පසින් වෙනස් වූ සමාජ වටපිටාවකි.

සමාජ ප්‍රශ්න මෙතරම් ඔඩුදුවා නැති තත්වයක් තුළ වුවද එදා අරගලයට සක්‍රීයව දායකත්වය දෙන්නට කාන්තාවන් පෙළගැසුණේ වඩාත් හොඳ සමාජ ක්‍රමයක් නිර්මාණය කර ගැනීමේ උතුම් අරමුණ පෙරදැරි කර ගනිමිනි. අද ප්‍රශ්න ඕනෑවටත් වඩා තිබේ. අසාධාරණයන් බැලූ බැලූ අත පෙනෙන්නට තිබේ. පීඩනය දරාගත නොහැකි තරමය. ඒත් බොහෝ කාන්තාවන් නිහඬය.

"අපි හම්බ කළොත් අපි කනවා", " අපිට දේශපාලනය වැඩක් නෑ" "මේක අපේ කරුමේ" වැනි මිථ්‍යාවන් විසින් විකෘති කරනු ලැබ ඇති කාන්තා මනසට ආණ්ඩු මාරුකිරීම, නායකයින් මාරු කිරීම වැනි දෙයක් හැර සමාජ ක්‍රමය වෙනස් කළ යුතුය යන්න ආගන්තුක සංකල්පයකි. ඒ නුපුරුදු අදහස කාන්තාවන්ට ඒත්තු ගැන්වීමේ දුෂ්කර කාර්යයට උරදීමට අප සූදානම්ය. ආර්ථික, සමාජයීය හා සංස්කෘතික වශයෙන් ඇති බාධක අභිබවා කාන්තාවන් තුළ චින්තනමය වෙනසක් ඇති නොකරන තාක් සමාජ පරිවර්තනය හුදු සිහිනයක්ම පමණකි.

වඩා යහපත් හෙටක් වෙනුවෙන් 71 අරගලයේදී අභීතව සටන් කළ ඒ ආදරණීය සහෝදරියන්ට සාධාරණයක් ඉටු වන්නේ කාන්තාවන් එකාවන්ව සමාජ වෙනසක් වෙනුවෙන් පෙළගැසෙන දිනක පමණකි. අදින් වසර 50කට පෙර මේ පොළොව මත ගලා ගිය ලේ, කඳුළු, දහඩිය වෙනුවෙන් අපට කළ නොහැක්කේ කුමක්දැයි අපි අපෙන්ම විමසා ගනිමු. ඉතිහාසය කියවා ගැනීමෙන් ඔබ්බට යනුයේ එවිට පමණකි.

# බක් මහේ මතකය



නොසිට බිහිරන් වගේ හිස මත - පාත්වුණ හෙණ ගෙඩිය නෑසුනු
වියළි පොළොවක නෙවෙයි කර්කෂ - කළු ගලක මුහුණතක පීදුනු
වඩා අඳුරැම දහවලක ඉර - බැහැපු අහසක පාට සේදුනු
එදා වාගෙම තවම පාටයි - බක් මහේ ඒ නැගුනු දේදුනු

බලා ඉව කර ගොදුරු සොයනා - ගිජු ලිහිණියන් සැරූ යාමෙක
නොබා අදිටන පෙරටුකොට ගෙන - සැබෑ කර ගනු පිණිස හීනෙක
තලා දැමුවත් ලෙයින් යකඩින් - අත් නොහළ අරමුණක වී එක
මරා අවසන් කළ නොහැකි බව - ලියා තිබුණා නිබය දෑසක

අඩක් සියවස් ගෙවී ඇත□ ඒ නමුත් නිමි නැත දුකක් දරුණු
එදත් වාගෙම අදත් වැඩියෙන් නැමෙනවා කොඳු නැමී කැඩුනු
වැටත් නියරත් ගොයම වනසයි කාට පවසම් ඇත්ත කරුණු
අවැසි සමයයි යළිත් එන්නට බක් මහේ වැසි සමග අකුණු

# සිව්දෙසින්

## යුක්තිය ඉල්ලා වීදියට




ලිංගික ප්‍රචණ්ඩත්වය නවතන ලෙසත් වින්දිතයින්ට සාධාරණය ඉටුකරන ලෙසත් බලකරමින් දහස් ගණනක් ඕස්ට්‍රේලියානු කාන්තාවෝ පසුගියදා එරට විරෝධතා පෙළපාලිවල නිරත වූහ. මෙලෙස විරෝධතා රැල්ලක් උත්සන්න වීමට ප්‍රබලතම හේතුව වූයේ ඕස්ට්‍රේලියානු පාර්ලිමේන්තුව සහ ආණ්ඩුව කේන්ද්‍ර කරගනිමින් පැනනගින ලද ලිංගික ප්‍රචණ්ඩත්වය සම්බන්ධ චෝදනායි. මෙම පෙළපාලි නම් කර තිබුණේ 'යුක්තිය උදෙසා පෙළපාලි' යනුවෙනි. රට පුරා නගර 40ක පමණ මෙම පෙළපාලි පවත්වන ලදී. විරෝධතාකරුවන් ප්‍රකාශ කරන ආකාරයට මෙය ඕස්ට්‍රේලියාව අත් දුටු විශාලම කාන්තා විරෝධතාවයයි. තවද කැන්බරාහිදී අත්සන් 90,000ක් සහිත පෙත්සමක් ඔවුන් විසින් නීති සම්පාදකයින් වෙත භාර දෙන ලද්දේ පාර්ලිමේන්තුව තුළ ලිංගභේදවාදී හැසිරීම් කෙරෙහි වග වන ලෙස බලකරමිනි.

## සම උරුමය වෙනුවෙන්



දේපළ උරුම වීම සම්බන්ධයෙන් පිරිමින් හා සමාන අයිතියක් කාන්තාවන්ටද ලබා දෙන ලෙස බලකරමින් ටියුනීසියානු කාන්තාවෝ උද්ඝෝෂණ රැලියක් පැවැත්වූහ. උතුරු අප්‍රිකානු රටක් වන ටියුනීසියාවේ උරුමය සම්බන්ධ නීතිය, ඉස්ලාමීය නීති පද්ධතිය මත පදනම් වන අතර ඒ අනුව පිරිමියාට කාන්තාවකට වඩා දෙගුණයක ප්‍රමාණයක් උරුමය ලෙස ලැබීමේ හිමිකම තිබේ. මේ හේතුවෙන් උරුමය සඳහා අයිතියක් තිබේ නම් එය ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයටම සමාන විය යුතු බව විරෝධතාකරුවෝ ප්‍රකාශ කරති.


## මාර්තු 8දා සිරභාරයට



මාර්තු 08 වැනිදා තුර්කියේ පැවැත්වූ කාන්තා දින සැමරුමේදී එරට ජනාධිපතිවරයාට අපහාස වන ආකාරයට කටයුතු කළේයැයි චෝදනා කරමින් කාන්තා ක්‍රියාකාරිනියන් 13දෙනකු සිරභාරයට ගෙන තිබේ. තුර්කියේ නීතිය අනුව ජනාධිපතිවරයාට අපහාස කිරීම වසරක සිට වසර හතර දක්වා සිර දඬුවම් ලැබිය යුතු වරදකි. මෙම නීතිය අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය සම්බන්ධ ජාත්‍යන්තර සම්මතයන් පවා උල්ලංඝනය කරන්නකි. තුර්කි බලධාරීන්ගේ මෙම ක්‍රියාමාර්ග ජාත්‍යන්තර මානව හිමිකම් සංවිධාන සහ මානව හිමිකම් ක්‍රියාකාරීන් විසින්ද හෙළා දැකිනු ලැබ තිබේ. ගෘහස්ථ හිංසනය සහ කාන්තාවක් වීම නිසා ඝාතනයන්ට ලක්වීම් වැඩි රටක් ලෙසද තුර්කිය වාර්තා වේ.

# නරුම සමාජයක් මැවූ ධනවාදය

15 වැනි හා 16වැනි සියවස්වල උපත ලද ධනවාදය ලාභ ලැබීම එකම අරමුණ කර ගත් ආර්ථික හා සමාජ ක්‍රමයක් විය. සිය කොමියුනිස්ට් ප්‍රකාශනයේදී ධනවාදය ගැන විස්තර කරමින් මාක්ස් හා එංගල්ස් පැවසුවේ "ධනපති පංතිය තම ප්‍රතිමූර්තියත් හා තමාට සමාන ලෝකයත්" නිර්මාණය කළ බවය. ඒ අනුව ධනවාදය ලාභ පසුපස හඹායන, මුදල් ඉපැයීමේ තරගයක යෙදුන, දේපළ ගොඩගැසීමේ කෑදරකමින් පිරුණ ධනපති පංතියක් හා ඊට ගැලපෙන සමාජයක්ද ඊට අනුව හිතන සමාජ මතවාදයක් සහිත ජනතාවක්ද බිහිකර තිබේ.



"මිනිසාගේ අති උතුම් වස්තුව ජීවිතයයි. එය ඔහුට ලැබෙන්නේ එක වරක් පමණකි. අරමුණක් නැතිව ජීවත්වීම නිසා කටුක වේදනාවක් ඇති නොවන සේ, නීච සහ නොවැදගත් අතීතයක් නිසා ලජ්ජාවීමට සිදු නොවනසේ ඔහු ජීවත්විය යුතුය. ඔහු මිය යනවිට ඔහුට මෙසේ කීමට පුළුවන් විය යුතුය: මගේ මුළු මහත් ජීවිතයත් මුළුමහත් ශක්තියත් ලෝකයේ අතිශයින්ම උදාර හා සුන්දර පරමාර්ථය උදෙසා, එනම් මිනිස් සංහතියට විමුක්තිය ලබාදීමේ සටන උදෙසා කැප කරන ලදී."

**නිකොලායි ඔස්ත්‍රොව්ස්කි,**
**'වානේ පන්නරය ලැබූ හැටි'**

## නව ලිබරල්වාදය මැවූ මිනිසා

ධනවාදය මේ වන විට එහි අවසාන ඉමට පැමිණ නව ලිබරල් උපායමාර්ගය තුළ ක්‍රියාත්මක වෙමින් සිටී. ලාභ පසුපස දිවීමේ නග්න කෑදරකම ලාභ වෙනුවෙන්, මුදල් හා දේපළ වෙනුවෙන් සියලු මනුෂ්‍ය සාරධර්ම අහෝසි කිරීම දැන් වඩාත් වැඩි වේගයකින් සිදුවෙමින් තිබේ. ලෝකය තුළ පවතින මහා පරිමාණ පරිසර විනාශයත්, ජනතාවට වස විෂ විකිණීම්, සමාජය දිළිඳුභාවයට, ලෙඩ රෝගවලට හා යුද්ධවලට ඇද දැමීමත් එහි ප්‍රතිඵලයන්ය.

මිනිසා දෙවියන් වහන්සේ විසින් මවන ලදැයි උගන්වනු ලැබූයේ බයිබලය හා දෙවියන් පිළිගත් ආගම් විසිනි. එහෙත් 19වැනි සියවසේදී මෙම මතය බිඳ දමමින් 'මිනිසා' සත්ව පරිණාමයේ ප්‍රතිඵලයක් බවත් වානර ප්‍රභේදයකින් නූතන මිනිසා හෙවත් හෝමෝසේපියන් සේපියන්වරු බිහිවූ බවත් ඩාවින් ඇතුළු විද්‍යාඥයෝ තහවුරු කළහ. එලෙස සත්ව පරිණාමයේ ප්‍රතිඵලයක් ලෙස 'සත්ව' ලක්ෂණවලින් මිදී 'මානව' ලක්ෂණ උරුමකර ගත් මිනිසා යළි පංති සමාජය තුළත් විශේෂයෙන් ධනවාදය තුළත් පරිණාමය වෙමින් පවතින්නේ මානව ලක්ෂණ අහෝසි කර ගනිමින් බව පෙනේ. නව ලිබරල්වාදය තුළ මෙය හොඳින් දැකිය හැක. මිනිසා සභ්‍යත්වයේ සිට යළි ම්ලේච්ඡත්වය කරා ගමන් කරනු දැන් දැකිය හැක.

## මිනිසා නරුමයෙක් වූ හැටි


මානව පරිණාමය සරලව ඉගැන්වීම සඳහා 'මිනිසා යෝධයෙක් වූ සැටි' නමින් සෝවියට් දේශයේ මුද්‍රණය කරන ලද පොතක් තිබුණි. එහෙත් දැන් අපට ලිවීමට සිදුව ඇත්තේ මිනිසා නරුමයෙක් වූයේ කෙසේද යන්න පිළිබඳවය. ලොව සියලු මිනිසුන් හා ගැහැනුන් නරුම නොවන බවත්, නරුමකමට එරෙහිව සටන් වදින පිරිසක් මිනිසුන් අතර සිටින බවත් ඔවුන්ට කරන ගෞරවයක් ලෙස සටහන් කළ යුතුය. එහෙත් නූතන ධනවාදය තුළ ලාභ ලැබීමේ අරමුණින් හතර අත දුවන අතලොස්සකුත් එම ක්‍රියා අනුමත කරන හෝ තමනුත් එසේ මුදල් ඉපැයීමට සිහින දකින බහුතර පිරිසකුත් සිටිති. අප ඉදිරිපිට තිබෙන දරාගත නොහැකි පිරිහීමට හා විනාශයට වගකිව යුතු අය ලෙස අපට පෙනෙන්නේ ඔවුන්ය.

එසේ නම් මේ වරද එවැනි මිනිසුන්ගේ පෞද්ගලික වැරැද්දක්ද? මෙම විනාශයට වගකිවයුතු වන්නේ තනි තනි මිනිසාද යන ප්‍රශ්නය අප ඉදිරියේ මතුවේ. සැබැවින්ම නැත. මිනිස්සු උපතින්ම නරක අය නොවෙති. මිනිසා උපතින්ම දුෂ්ට නැත. එහෙත් දුෂ්ට, වැරදි, ආත්මාර්ථකාමී ආර්ථික ක්‍රමයකට, එම ක්‍රමය මත පදනම් වූ සමාජයකට එම ක්‍රමය උත්කර්ෂයට නංවන මතවාදයකට හා භාවිතයකට මිනිසුන් දුෂ්ට, නරක මිනිසුන් කළ හැක; නරුමයන් කළ හැක. අප මේ දකිමින් සිටින්නේ එයයි.

නරුමයා යනු කවුදැයි පැහැදිලි කළ චින්තකයෙක් හා කතුවරයෙක් වූ ඔස්කා වයිල්ඩ්, නරුමයා යනු හැම දේකම මිල දන්නා එහෙත් වටිනාකම නොදන්නා පුද්ගලයා යයි පැවසීය. දැන් අපේ සමාජයේ බලය අතැතිව සිටින්නේ එවැනි අයය. එකී බලය හා නරුමකම අනුමත කරන්නේද එවැනිම අයය. මිනිසා තුළ මෙම 'නරුමකම' නිර්මාණය කොට ඇත්තේ අන් කවරෙකුවත් නොව ලාභ හා මිල පසුපස හඹා යාමට මිනිසාට බලකොට ඇති වත්මන් නව ලිබරල් ධනපති ක්‍රමයයි.

## වටිනාකම් නොදකින මිල දකින

වර්තමානයේ ලොව පුරා මෙන්ම අප රටේද විශාල වන සංහාරයක් පරිසර විනාශයක් තිබේ. ඒ හුදකලා මිනිසුන් කැලයකින් කෝටුවක් හෝ ගසක් කපා ගැනීම නිසා නොවේ. බහුජාතික හා දෙශීය සමාගම්කරුවන්, කළු ව්‍යාපාරිකයන් ලාභ සඳහා මහා පරිමාණ වගාවන්ට හෝ ඉදිකිරීම් වෙනුවෙන් අක්කර දහස් ගණනින් වනාන්තර එළිකිරීම නිසාය. වර්තමානයේ බිඳවැටී ඇති ආර්ථිකය තුළ පාඩු ලබන ව්‍යාපාර හා එහි ප්‍රාග්ධනය ලාභ ලැබිය හැකි තැන් කරා මාරුවෙමින් තිබේ. ඒ සඳහා ගොදුරු වී ඇත්තේ



කැලෑවන් හා ඉඩම්ය; ඉදිකිරීම් සඳහා අමුද්‍රව්‍යයන්ය. එවිට එවැනි අරමුණකට වැටුන ජාවාරම්කරුවන්ට වනාන්තරවල හෝ ගස්වල වටිනාකම පෙනෙන්නේ නැත. ඒ වෙනුවට ඒවායේ මිල ඔවුනට පෙනේ. ඔවුහු පරිසරයේ වටිනාකම නොදනිති. එහෙත් ගස්වල, පස්වල, ගල්වල මිල දනිති. එවිට එක් අතකින් ගස් කපන අතර අනෙක් පසින් පස් කැපීමද, ගල් කැඩීමද මහා පරිමාණයෙන් සිදුවේ. මන්ද ලාභය අරමුණ බවට පත්වූ මිනිසුන් පරිසරය නොදකින අන්ධයන් වන නිසාය.

ලංකාව වැනි රටවල පාලකයන්ද ජාවාරම්කරුවන් වන අතර නැතිනම් ජාවාරම්කරුවන්ගෙන්, සමාගම්කරුවන්ගෙන් යැපෙන්නෝ වෙති. එවිට සමාගම්කරුවෝ ලාභය පමණක් සිතා පරිසරය වනසති. ඉන් ඇතිවන විපතද යළි ලාභ ලබන මාර්ගයක් කර ගනිති.

ලංකාවේ සමහර කර්මාන්තශාලා ලාභ උපරිම කර ගැනීම වෙනුවෙන් වියදම් අඩුකර ගැනීමට කටයුතු කරයි. සේවකයන් උපරිම ලෙස සූරා කයි. ඊට අමතරව කර්මාන්ත ශාලාවේ අපද්‍රව්‍ය නිවැරදි ලෙස බැහැර කරනවා වෙනුවට පහසුවට ගංගාවලට, ජලදහරාවලට හෝ පොළොවට එකතු කරයි. එලෙස කල් යනවිට ජලය අපවිත්‍ර වෙයි. එය සමාගම් හිමිකරුවාට ප්‍රශ්නයක් නොවේ. ඔහු දකින්නේ ලාභය පමණි. ගංගා, ඇල, දොල ජලය හා භූගත ජලය අපිරිසිදු වී පානීය ජල ප්‍රශ්නය මතුවූ විට සමාගම්කරුවෝ වහා ඉදිරිපත් වී ඊටද විසඳුම් දෙති. ඒ ජලයද වෙළඳ භාණ්ඩයක් කර ජලයට මිල නියම කිරීම මගිනි. එවිට බෝතල් කළ පානීය ජලය වෙළඳපොළවල් පුරා පැතිර යයි. ඒ සමග තවත් පරිසර ගැටලුවක් මතුවේ. ඒ ප්ලාස්ටික් විශාල වශයෙන් පරිසරයට එකතුවීමය. එහෙත් වතුර බෝතල් කරන්නන්ට එය අදාළ නැත. සැබැවින් වතුර බෝතල් නිපදවන සමාගම්කරුවෝ වතුර නිපදවන්නේ නැත. ඔවුන් නිපදවන්නේ ප්ලාස්ටික් බෝතල්ය. එහෙත් ඔවුන් වතුර විකුණා ලාභ උපයති. මේ ක්‍රමය තුළ වතුර විකුණන්නා සේම බොන්නාද වගකීම් විරහිතය. වතුර විකුණන සමාගම් ප්ලාස්ටික් බෝතලයේ වතුර දමා විකුණන අතර එය පානය කරන්නා ඕනෑම තැනක පරිසරය තුළ එම බෝතලය දමා යාමෙන් විශාල හානියකට දායක වෙයි. නරුම චින්තනය සමාජය තුළ පැතුරුන විට සිදුවන දේ එයයි. පානීය ජලය බෝතල් කොට විකුණන මේ ක්‍රමයම හෙට දිනයේ මිනිසුන්ට හුස්ම ගැනීමට ඔක්සිජන්ද බෝතල් කර විකුණනු ඇත. දැනට ඔවුන් ඒ සඳහා කරමින් සිටින්නේ පරිසර පද්ධතිය විනාශකිරීම හා වනාන්තර එළිකිරීමය. ඒ ධනවාදයේ හැටිය.

## රස කිරීමට වස කැවීම

අපේ රටවල ආහාර කර්මාන්තය තුළද මේ නරුමකම දැකිය හැක. ආහාරවලට අපද්‍රව්‍ය, වස විෂ මුසුකිරීම දැන් සුලබව සිදුවේ. ලංකාවේ ආහාර සඳහා යොදන බොහෝ රසකාරක හා වර්ණක පිළිකාකාරක නැති නම් දියවැඩියාව, අධික තරබාරුව සඳහා හේතු වන දේවල්ය. මෙම වස සහිත ආහාර විකුණන සමාගම් රූපවාහිනී දැන්වීම් මගින් පරිභෝගිකයින් ඒ වෙත ඇද ගනී. මෙහිදී ළමුන් විශේෂය. එහෙත් මෙය වැළක්වීමට ආණ්ඩුවලට වුවමනාවක් නැත. ඒ නිසාම ඒ පිළිබඳ ප්‍රමිතියක්ද නැත. වස සහිත ආහාර විකිණීමද ඉන් රෝගී වන ජනතාවට ඖෂධ විකිණීමද යන දෙකම ජාවාරම් බවට පත්වීම මේ ක්‍රමයේ ස්වභාවයය.

මෙම විනාශය නව ලිබරල්වාදය තුළ හැම ක්ෂේත්‍රයක් පුරාම පැතිර තිබේ. අධ්‍යාපනය සේවාවක සිට ලාභ ලබන ව්‍යාපාරයක් කළ විට, සෞඛ්‍යය සේවාවක සිට ලාභ ලබන ව්‍යාපාරයක් කළ විට, ගමනාගමනය මහජන සේවාවක සිට ලාභ උපයන තරගයක් බවට පත් කළ විට, අධ්‍යාපනය තුළින් මානව හැඟීම් නැති, මනුෂ්‍යත්වය නැති, සමාජ සාමූහිකත්වය පිළිබඳ අවබෝධයක් නැති, මනස රෝගී වූ පුරවැසියෙක්ද සෞඛ්‍යය තුළින් ඖෂධ මත යැපෙන ශාරීරිකව රෝගී වූ පරපුරක්ද, බිහිවේ. ලංකාවේ ප්‍රවාහන සේවය, මගමරුවා වර්ගයේ ප්‍රවාහනයක් බවට පත්ව තිබෙන්නේද මේ නිසාමය. මේ තත්වය නිසා රටකට අහිමි වන ස්වාභාවික සම්පත හා මානව සම්පත විශාලය. අනාගතය ගොඩනැගීමට ඇති, මානව වර්ගයාගේ සියලු අවශ්‍යතාවයන් ඉටුකිරීමට හැකියාව ඇති ස්වාභාවික සම්පත හා පරිසරයත් මානව සම්පත හා මානව චින්තනයත් විනාශ වීම රටකට දරාගත නොහැකි බරක්, අපරාධයක් වේ.

මේ සඳහා තනි තනි මිනිසුන්ට දොස් කීම සමාජය පිරිහීම පිළිබඳ මැසිවිලි නැගීම ඵල රහිතය. දැන් කළ යුතු වන්නේ පරිසරයේ පැවැත්මටද, මානව වර්ගයාගේ පැවැත්මටද, මානව ගරුත්වයට හා මානව සිතිවිලිවලටද, අභියෝග කර ඇති, මානව වර්ගය යළි ම්ලේච්ඡත්වය කරා ඇදගෙන යමින් සිටින මේ නව ලිබරල්වාදය එනම් ධනවාදී ක්‍රමය පැරදවීමය. ඒ හැර අනෙක් විකල්පයක් සමාජය ඉදිරිපිට නැති බව වටහා ගැනීමය; වටහා දීමය.

# පො ලිටිකල් පංතිය

පොලිටික්ක දවසක් උදේම ඇවිල්ල ළමයි එනකොටත් කරටි කඩාගෙන මොනවද ලියනවා. ලියනවා කිවුවට ලියනවමත් නෙමෙයි ෆෝම් කොළ මිටියක් තියාගෙන පුරෝනව. ඉහ උස්සන්නෙවත් නැති හින්දා ළමයි එකා එකා ඇවිත් ඉඳගත්තට බාධා කරන්න ගියේ නෑ.

"ගුඩ් මෝනිං සර්" බලන් ඉන්න බැරිම තැන අනුරුද්දිය ඇහුවෙ නිකමට හරි පොලිටික්ක ඔළුව ඉස්සුවොත් එක වැටෙයි කියල.

"වෙරි ගුඩ් මෝනිං සර්" වසන්තියත් හයියෙන් කිවුවෙ අනුරුද්දියට සෙකන්ඩ් වෙන්න බැරිකමටත් වඩා තමන් කිවුව මෝනිං පාර පොලිටික්කගෙ කණට වැටෙන්නම ඇති කියල හිතාගෙන.

"ආ... ඔය ළමයි ඇවිල්ල නේද? ආයුබෝවන් ළමයිනේ" පොලිටික්කගෙ කලබලේට එක කොළේක කොටුවක් හරහා ඉරකුත් ඇඳුණා.

"අපි ඩිස්ටර්බ් කළේ නෑ... සර් බර වැඩක හින්දා" මංජුව කිවුවෙ පශ්චාත්තාප ස්වරයකින්.

"නෑ ළමයිනේ මේ පොඩි වැඩක්" පොලිටික්ක අත් දෙකෙන් කොළ මිටිය වහනව.

"පොඩි වැඩක් වෙන්න බෑ සර්. අපි ආවත් හරි, සර් කොළ කීයක්නම් පිරෙව්වද?" කනිය උසාවියෙ හරස් ප්‍රශ්න අහනව.

"නෑ මේවා මේ... නෑ මේවා... නෑ... එක්කො ඕනෙ නෑ මේවා ඔය ළමයින්ට" පොලිටික්ක ළඟ නමලා වැඩේ වැහුව.

"ඔච්චර කොළ පුරවලත්... පොඩි වැඩක් කියන්නෙ කොහොමද සර්?" මංජුව ආයෙත් ඇවිස්සුව.

"ඔය ළමයි මේක තැන තැන කියනව නෙමෙයි... මේක සමීක්ෂණ පත්‍රිකාවක්. ආණ්ඩුවෙ ප්‍රගතිය මනින්න කරපු එකක්. මට ඕවා බෙද බෙද ඉන්න බෑ. මමම ටිකක් පුරෝල දැම්ම" පොලිටික්කගෙ කන් ටික ටික රතු වුණා.

"මේ තියෙන්නෙ ආණ්ඩුව නැගලා යනව කියල" පොලික්ක කණ අතගාන අතරෙ ආපු හුළඟට ගහගෙන ගිය උඩම කොළේ ඇහිඳගත්ත කනිය කිවුව.

"නැගලා යනව කියන්නෙ ඩොලර් එකද? බඩුමිලද?" සමන කිවුව කතාවට පොලිටික්කත් හිනා පැන්න.

"කියවන්න එපා ළමයිනේ... මෙහෙ දෙන්න ඕක. අපිටත් මොකද්ද වගේ මේව කියවන්න... කොහොමද ළමයිනේ අවුරුදු? කොහා කෑගහනව ඇහුණෙත් නෑ" පොලිටික්ක සමීක්ෂණ චැප්ටර් එක ක්ලොස් කරලම දැම්ම.

"මං හිතන්නෙ කොහා කෑ ගහනව. අපිට ඇහෙන්නෙ නෑ" මංජුව අලුත් සොයා ගැනීමක් කළා.

"ඒ මොකද කොහා උගෙ ස්වර සංඛ්‍යාතය වෙනස් කරලද?" වසන්තිය කලින් ඉගෙන ගත්තු විද්‍යාව පාඩමක් මතක බව පෙන්නුව.

"අයියෝ... ඔළුව කොලොප්පං කරගන්න තරම් සංකීර්ණ දෙයක් නෙමෙයි... කොහා ඇවිත් ඉන්නෙ ෆේස් මාස්ක් දාලා. ඉතින් කෑ ගැහුවට හඬ එන්නෙ නෑ" මංජුව සෞඛ්‍ය පාඩමට මාරු වුණා.

"නෑ... ඒක නෙමෙයි. කොහා ආවට තාම ඉන්නෙ අහසෙ... අපිට පේන්නෙ නෑ" සමන කොවුල් ජාතකේ අග මුල පැහැදිලි කරන්න හැදුව.

"අහසට වෙලා මක් කරනවද? එතකොට මේ සැරේ පහළට එන්නෙ නැද්ද?" වසන්තිය පැහැදිලි කිරීමක් ඉල්ලුවෙ ඇත්තටම එන එකක් නැතිවෙයි කියල දුකෙන්.

"එන්න ඕනෑකම තියෙනව. එත් පහළට ඇවිත් වහන්න ගස් නෑ. සර්ගෙ කට්ටිය කපලා. සර්ගෙ කිවුවට අපේ සර්ගෙ නෙමෙයි... අර සර්ගෙ. ඉතින් කොහාගෙ හඬ නෑ. පාරෙ අයිනෙ එරබදු ගස්වලට වැඩේ දීල. ඒ හින්දා එරබදු මල් නෑ. ඔන්චිල්ලා බඳින්න ගසුත් නෑ. ළමයින්ට වෙලාවකුත් නෑ. ඉතින් ඔන්චිලි වාරම් නෑ. කහ නැති හින්දා කොකිස් පාට නෑ. පොල් තෙල් විස හින්දා කැවුම් කොකිස් බැදගන්න බෑ. හාල් පොල් ගණන් හින්දා කිරිබත් නෑ. අතේ සල්ලි නැති හින්දා කොහොමත් අවුරුදු නෑ. කොහා කෑගැහුවත් වැඩකුත් නෑ." සමන කියාගෙන යද්දි අපරාදෙ කොහෙක් ඇදල ගත්තෙ කියල පොලිටික්කට හිතුණා.




# සදා දිදුලන රතු ස්මාරකය...

ලිට්ල් ස්ටාර්, සුපර් ස්ටාර්, 60 ප්ලස් ස්ටාර්ලා දක්වා අද අපේ රටේ තරු වැහිවැහැලාය. අනෙක් පැත්තෙන් රණ විරුවෝ, රට විරුවෝ, සුව විරුවෝ යනාදී ලෙස විරුවන් වැහි වැහැලාය. රට පුරාම විරු තරු හදන මාධ්‍ය ෆැක්ටරි දුසිම් ගණනක්ය. සැමන් ටින් හදන ෆැක්ටරියක යන්ත්‍රයකින් සැමන් ටින් එන්නාසේ පට පටගා මේ තරු සහ විරුවන් 'නිෂ්පාදනය' වන්නේය. එහෙත් මේ කිසිදු වෙළෙන්දෙකුට අන්දන්නට බැරි, අන්දවා වෙළඳ භාණ්ඩ බවට පත් කළ නොහැකි සැබෑ විරුවන් පිරිසක් ගැන මේ බක් මහේ අපේ මතකයට නැගේ. අද පමණක් නොව හැමදාමත් රටට, රටේ දුක්විඳින මිනිසුන්ට, සැබැවින්ම ආදරය කරන මිනිසුන්ගේ සිත්වලින් ඔවුන් කවදාවත් මැකී නොයේ.

පෞද්ගලික යසස, කීර්තිය හෝ වස්තුව පසුපස හඹා නොගොස් මේ රටට, රටේ පීඩිත පංතියට සැබෑ ලෙසම ආදරය කිරීමේ වරදට, ජනතාවගේ විමුක්තිය වෙනුවෙන් දිවි පුදා සටන් වැදුණු වරදට පංති සතුරා විසින් අපෙන් උදුරාගත් ඒ උත්තුංග මිනිසුන් වෙන කිසිවෙක් නොව අප්‍රේල් විරුවන්මය. මේ උදාවන්නේ ඓතිහාසික අප්‍රේල් අරගලයේ 50වැනි සැමරුමයි. මේ සදා සැමරෙන සොහොයුරන්ගේ සුසුදු අල්තාරයන් ඉදිරිපිට රත් කුසුම් තබා අප සපථ කර සිටින්නේ ඔවුන් ප්‍රාර්ථනා කළ ලෝකය අපේ දෑතින් නිමවීමට කැපවන බවය.

අප්‍රේල් විරුවන් විසින් අපට කියාදුන් හොඳම සහ කදිම පාඩම වන්නේ කුමක්ද? ඒ අප විසින් ගොඩනැගිය යුත්තේ අපේ පසුපස



ඇදී එන මිනිසුන් නොව අපද ඉක්මවා අපට ඉදිරියෙන් යන මිනිසුන්ය යන්නයි. අප්‍රේල් විරුවන්ගේ භූමිකාවේ වත්මන් අවධිය නියෝජනය කරන අප එදා ඔවුන් ඉල්ලූ දේ කොතෙක් දුරට ඉටුකර තිබේද? ඊට කොතෙක් දුරට සමත්වී තිබේද? අපේම හෘදය සාක්ෂිය ස්පර්ශ කර ගනිමින් එම ප්‍රශ්නවලට පිළිතුරු සොයා ගතහොත් අප අපවම සොයාගත්තා වන්නේය. අප අපවම සොයා ගැනීම පනස් වසරක් සපිරෙන අප්‍රේල් විරුවන්ගේ අරගලයට පිදෙන ඉහළම ගෞරවය වන්නේය.

# මේ ළමයා කොයින්දෝ කොයි කැලයෙන් ඇහින්දෝ...

ලාංකේය සමාජයේ බොහෝ දෙනෙක් "පොරවල්" බවට පත්වන්නේ නොදන්නාකමේ සීමාවන් තුළය. නන්දසේනලාට, සිරිසේනලාට රටේ ජනාධිපති කිරුළටද හිමිකම් කියමින් රටේ ජනයා දිගින් දිගටම ඇන්දීමට හැකිවී ඇත්තේද මේ හේතුව නිසාය.



"ගෝඨාභය කියන්නේ මාර වැඩ්ඩෙක්, ගෝඨා දිනපු ගමන් හොරකම්, වංචාකරලා ඉවරයි.", "දූෂිතයො අපරාධකාරයො සුනේ සුන්.", "කැලෑපාලුවෝ ඉවරටෙම ඉවරයි.", " වැඩ නොකරන ලොක්කන්ට නම් ගෝඨාගෙන් කිසිම ගැලවීමක් නෑ.", "රට හදන්න නම් ගෝඨාභය වගේ කෙනෙක් එන්නම ඕන"

ඡන්දයට පෙර රටේ බහුතරයක් ජනයා හිතුවේ එහෙමය. දැන් ගෝඨාභය වගේ කෙනෙක් නොව ඔහුම ජනාධිපති වී තිබේ. දැන් සිදු වී තිබෙන්නේ කුමක්ද?

සැබැවින්ම අසන්නට ඇත්තේ ගෝඨා යන යන තැන නාගන්නා එකය. අතගැසූ හැම දෙයම අසාර්ථක වන එකය. ආර්එම්වී එකට ගොස් නිලධාරීන්ට තගදමා වැඩ පටන්ගත් ගෝඨාභය, රාජ්‍ය ආයතන කිහිපයකටම කඩා පැන 'හරියට වැඩ කරනු, නැත්නම් ගෙදර යනු' යැයි මාධ්‍ය සංදර්ශන දමා ගෝරනාඩු දුන් ගෝඨාභය දැන් කියන්නේ මොකක්ද? නිලධාරීන් කරන වැරදිවලට මම මොනවා කරන්නද? කියාය. ඒවාට මට බැනලා වැඩක් නෑ කියාය. ඔහු ඉතාම ළඟකදී කියා තිබුණේ "කැලෑ කපන්න අවසර දෙන්නේ නිලධාරින්. ඒ ගැන මම දන්නෙවත් නැහැ. ඒකට මට බැනලා වැඩක් නෑ" කියාය. එහෙම කියන ගමන් ඔහු අනෙක් පැත්තට කියන්නේ "මට කට්ටිය කියනවා මම ෆේල් කියලා. මම ෆේල් නෑ. මම තමයි යුද්ධය දිනුවෙ. ඒකට මට ඩබල් ඩිග්‍රි තියෙනව. ඒකට පීඑච්ඩීත් ගහල මම ඉන්නෙ. දැන් කරන්නෙ බෝනස් වැඩ ටිකක්. මම කරන්න ඕන ඒව කරල ඉවරයි කියාය".

"මම ෆේල් නෑ. මම පාස්" කියා කියන විටම ඔහු 'ෆේල්' බව ගෝඨාගේ ළමා මනසට නොතේරුණාට මේ රටේ සාමාන්‍ය ජනයාට නම් තේරෙයි. ගෝඨාභය මාධ්‍ය ඉදිරියට පැමිණ කරන කථාවලින්ම තමා දරන පදවියට තමා නුසුදුස්සෙකු බව නැවත නැවතත් ඔප්පු කරමින් සිටී. එක් අතකට මේක ගෝඨාභයගේ වරදක් නොවේ.

අපේ රටේ වර්ධනය වූ නිෂ්පාදන බලවේග මත සංවිධානය වන දේශපාලනයක් හෝ මතවාදයක් නොමැත. ඒ නිසා නිෂ්පාදන ආර්ථිකයක් තුළ සමාජයේ තිබෙන මිනිස් සබඳතා තේරුම්ගත් දේශපාලඥයින් අපිට නොමැත. මේ තත්වය තුළ අපේ රටේ වැඩි වශයෙන් දේශපාලකයින් වෙන්නේ හොරු, මිනීමරුවො, පාතාලයො, අලසයො, නීතීඥයො, නළුවො, සොල්දාදුවො වැනි අයය. මේ මිනිසුන් ධනවාදී ආර්ථිකය ගැන දන්නා මළ දානයක් නැත. සමාජවාදය ගැන නම් කොහෙත්ම දන්නෙ නැත. එක් එක් බහුබූත සංකල්ප සමග හිටිගමන් පොළොවට පාත්වෙති. ක්ෂණයකින් වාෂ්ප වී යති. එහෙත් සැබැවින්ම මේ සමාජයට සැනසුම් සුසුම් හෙළීමට හැකි වන්නේ මේ තකතීරු දේශපාලනය වාෂ්ප කළ දාටය.

# පණ තිබුණත් - නැණ නැත්නම්



දියුණු පාර්ලිමේන්තු ක්‍රියාදාමයක ප්‍රතිඵලයක් ලෙස අඩුම තරමේ ධනේශ්වර අර්ථයකින්වත් ප්‍රජාතන්ත්‍රීකරණයවීමක් අපේ රටේ පාර්ලිමේන්තුව හෝ සමාජය තුළ සිදුවී නොමැත. නව සමාජ සබඳතා ගොඩනැගෙන්නේ ඊට අවශ්‍ය නව ව්‍යවස්ථා ගොඩනැගෙන්නේ සමාජ දේශපාලනික වර්ධනයේ ප්‍රතිඵලයක් ලෙසය. රටේ ආරක්ෂාව, ජනජීවිතවල ආරක්ෂාව යනු අද වැඩවසම් ප්‍රභූන්ගේ, පාලකයින්ගේ ආරක්ෂාව බවට අර්ථ ගැන්වී තිබේ. දිවිහිමියෙන් ජාතික ආරක්ෂාව ජනතාවගේ ආරක්ෂාව රකින්නෙමියි කියා දස අතේ දිවුරුම් දී බලයට ආ රාජපක්ෂ පවුල් පාලනය යටතේ අද අපි දකින්නේ කුමක්ද? තම පෙම්වතියගේ හිස කඳින් වෙන්කර කඳ ට්‍රැවලිං බෑගයක දමා රටේ පොදු ප්‍රවාහන සේවයට අයත් බස් රථයක දමා ගෙනැවිත් රටේ ප්‍රධානම නගරයේ වීදියක් මැද දමා නිදැල්ලේ යන නරුමයින්වය. රට ඉන්න තම ස්වාමියාගෙන් මුදල් ගෙන්වා ගැනීම සඳහා තම මාස නවයේ දරුවාට වද දී එය වීඩියෝ ගතකර තම ස්වාමිපුරුෂයාට දැක ගැනීමට සලස්වන කුරිරු මව්වරුන්ගේ දසුන්ය. වැසී ඇති යක්ෂයා පළවා හැරීමට කියා යකැදුරා විසින් තම සත් හැවිරිදි දියණියට දසවද දී මරා දමන අන්දම සංසුන්ව බලා සිටින උමතු අම්මලාගේ දසුන්ය. මේවා මෙසේ වන්නේ ඇයි? අද අපේ රටේ ඊනියා ධනේශ්වර දේශපාලන ආයතන වැඩවසම් දේශපාලන ආයතන බවට පත් කර ගනු ලැබ ඇත. ඒවායේ සිංහාසනාරූඪ වී සිටින්නේ වැඩවසම් රජවරුය. උසස් සමාජ සම්මුතීන් හා භාවිතයන් වෙනුවට බලහත්කාරය, හිතුමතය, දෙවියන් සහ දේවාල, කෝවිල් හදිහූනියන්, අසූහාරදහස් වාරයක් ජීවං කරන ලද තෙල්, නූල්, සෙත්කවි, වස්කවි, ඊරාෂ්ඨක, සුහමූර්ති, මරු සහ රාහු සිටින දිශාවන්, රාජ්‍ය පාලනයත් සමාජයත් සමඟ සම්මුති ගතවී ඇත. රට මෙහෙය වන පාලකයින්ගේ ඔළුගෙඩි අඳුරු, භූත, හොල්මන්, විකාර පුරවා ගත් භූත ජෝගු බවට පත්වී ඇත. ධනේශ්වර යැයි කියාගත් පාර්ලිමේන්තුව දේවවරම්වාදය අනුමත කරන ආයතනයක් බවට පත්වී ඇත. ආයතනවල බලය මාරුවීම පවුල් සතු උරුමයක් වී ඇත. එම බලය අද්භූතය. ආකස්මිකය. ස්වාභිකව ගල් ගැසුවාක් වැනිය. එය ප්‍රශ්න කිරීමට හෝ විග්‍රහ කිරීමට සමාජය සතු පොහොසත් උපකරණ හිඟයකට මුහුණදී සිටී. එනිසා ප්‍රහාරය එල්ල කළ යුතු තැන ප්‍රහාරය නොදී ගෙදර එල්ලා තිබෙන මුවහමට තඩිබාන තත්වයකට අද ලාංකේය සමාජය ඇදවැටී ඇත. මෙවැනි සමාජයක මෙවැනි නරුම දේවල් මතුවීම අරුමයක් නොවේ. ඒත් මේ දේශපාලන කරුමය උරුමයක්සේ භාරගෙන තවදුරටත් කල් ගෙවන්නේ නම් ඔළුව නැති 'මළ' කඳන්වලින් මේ සමාජය පිරී යන දිනය වැඩි ඈතක නොවේ.

# සමාජ ආර්ථික දේශපාලනික...

05 පිටුවෙන්....

ඒ වගේම ඩොලර්100ක් වටිනා බැඳුම්කරයක් අද විකිණෙන්නේ ඩොලර් 59කට. මේ අනුව ස්වෛරීත්ව බැඳුම්කරවලින් ණය ගන්න බෑ. හැබැයි කොරියාව නිකුත් කර තිබෙන 2029 කල්පිරෙන බැඳුම්කරයක් වෙනුවෙන් පොලිය 2.5%ක් නියමවෙලා තිබෙද්දිත් ද්වීතික වෙළඳපොළේ ඩොලර් 100 වෙනුවට විකිණෙන්නේ 103 ගානේ. මේකෙන් කියැවෙන්නේ මොකක්ද? අපේ රටට ඩොලර්වලින් ගෙවීමේ හැකියාව හීනවී තිබීම සහ කොරියාවට ඒ හැකියාව ඉහළම අගයක තිබීමයි. 2020දී අපේ රටේ ස්වෛරීත්ව බැඳුම්කරවලින් අලුතින් ණය ගන්න බැරිවුණා. රටේ ණය ගෙවීමට හිඟ වී තිබෙන ඩොලර් බිලියන නවයක මුදල හොයාගන්න සම්පත් විකිණීමත් විදේශයන් ඉස්සරහා නැවත නැවත යටත්වීමටත් සිදුවී තිබෙනවා.

ජාතික ධනය සාධාරණ ලෙස බෙදෙන්න ඕනෑ. සමාන ලෙස බෙදෙන්න ඕන කියලා අපි කියන්නේ නැහැ. අද වෙනකොට ජාතික ධනයෙන් 1.6%ක් පහළම ආදායම් ලබන ජනතාවගෙන් 10%ක් වෙත බෙදී යනවා. ඉහළම ආදායම් ලබන 10% වෙනුවෙන් ජාතික ධනයෙන් 35.8%ක් බෙදිලා යනවා. 2020දී ආර්ථික අර්බුදය කොවිඩ් වසංගතය නිසා තවත් තීව්‍ර කළා. ඒ අතර මනෝ සෙල්වනාදන් සහ හරීන් සෙල්වනාදන්ට අයත් 'මුදිත්දා' කියන සමාගමේ 2019 ලාභය මිලියන 1019 වෙද්දී 2020දී මිලියන 11,322 දක්වා ලාභය අවුරුද්දක් තුළ දසගුණයකින් වැඩිවෙලා තිබෙනවා. පාරේ කොළකැඳ විකුණපු කෙනාගේ ආදායම, තැඹිලි විකුණපු කෙනාගේ ආදායම පහත වැටුණා. කම්කරු රැකියා කරපු කෙනාගේ ආදායමත් අඩු වුණා. හැබැයි මනෝ සෙල්වනාදන් සහ හරීන් සෙල්වනාදන්ට අයිති සමාගමේ ලාභය දසගුණයකින් වැඩිවුණා. හනීෆ් යූසුෆ් මහත්තයාගේ 'එක්ෆෝ ලංකා' සමාගමේ 2019 මිලියන 1909ක් වූ ලාභය 2020දි මිලියන 14,480ක් වෙනවා. එයාගේ ලාභය හත්ගුණයකින් වැඩිවෙලා. ධම්මික පෙරේරාගේ 'හේලීස්' සමාගමේ 2019දී මිලියන 2,750ක් වූ ලාභය 2020දි 10,338ක් වෙනවා. රටේ සියලු දෙනාගේ ආදායම් අඩු වෙනකොට මේ අයගේ ලාභය විශාල වශයෙන් වැඩිවෙලා. රටේ මහා ධනයක් නිෂ්පාදනය වුණාට ඉතා කුඩා කණ්ඩායමක් අතේ සංකේන්ද්‍රණය වෙලා තිබෙනවා. අපේ ආර්ථිකයේ ප්‍රධානම අර්බුදය ජාතික ධනය සාධාරණව බෙදී නොයාමයි.

ජනගහනයෙන් පහළම ආදායම් ලබන 70%ක් දෙනා ජාතික ආදායමෙන් ලබාගන්නා පංගුවට සමාන ප්‍රමාණයක් ඊළඟ 10%ක් දෙනා ලබාග න්නවා. ඒතරම් විශාල ආදායම් බෙදීයාමේ විෂමතාවක් නිර්මාණය වෙලා තිබෙනවා. ඒ නිසා ග්‍රාමීය ජනතාව විශාල දුප්පත්භාවයකට ඇදවැටිලා මිලදී ගැනීමේ හැකියාව ඉතාම අවම වෙලා තිබෙනවා. එහෙම වුණාම බිස්කට් විකිණෙන එක අඩුවෙනවා, පපඩම් විකිණෙන එක අඩුවෙනවා, ආදායම් බෙදීයාමේ විෂමතාවයෙන් ග්‍රාමීය ජනතාවගේ ආර්ථිකය කඩාවැනෙවා විතරක් නොවෙයි ආර්ථිකය අර්බුදයකට ලක්කරනවා. අපේ රටේ ආර්ථිකය මුහුණ දී තිබෙන දෙවැනි අර්බුදයි මේ.

මීට කලින් ආර්ථිකයේ ඇතිවී තිබෙන අර්බුදයට හේතුව යුද්ධය කිවුවා. පාලකයෝ වේදිකාවලදී මල්ටි බැරල්වලින් ප්‍රහාර එල්ල කරනකොට යන වියදම් ගණන් හදල පෙන්නුවා. අනෙක් උණ්ඩවලට යන වියදම් හදලා පෙන්නුවා. යුද්ධය අවසන් වුණාම ආර්ථිකය හදන බව කිව්වා. එහෙම නම් ජනතාව තේරුම් ගන්න ඕනෑ ආර්ථික අර්බුදයට හේතුව යුද්ධය නොවන බව. ඇත්ත ගත්තොත් යුද්ධය ජනිත කළේත් ආර්ථික අර්බුදය විසින්මයි. තව ටිකදවසකින් ආර්ථික අර්බුදයට හේතුව කෝවිඩ් බව කියන්න පටන් ගන්නවා. හැබැයි කෝවිඩ් එන්න කලිනුත් 2020 පළවෙනි කාර්තුවේ ආර්ථික වර්ධන වේගය -1.7යි. දෙවැනි කාර්තුවේ ආර්ථික වර්ධන වේගය -16.3යි. ඒ නිසා කොවිඩ් වසංගතය අපේ ආර්ථික අර්බුදය තීව්‍ර කරලා තිබෙන එක ඇත්ත, යුද්ධයෙන් ආර්ථික අර්බුදය තියුණු වූ බව ඇත්ත. හැබැයි කෝවිඩ් හෝ යුද්ධය අපේ ආර්ථික අර්බුදයේ පතුළ නොවෙයි. පතුළේ තිබෙන්නේ විශාල ණය කන්ද, ජාතික සම්පත් අත්හැරීම, වගේ සාධක.

ආර්ථික අර්බුදය, ආර්ථික ක්ෂේත්‍රයේ විතරක් රැඳෙන්නේ නැහැ. ආර්ථික අර්බුදයෙන් සමාජ අර්බුදයන් නිර්මාණය කරනවා. සෑම ක්ෂේත්‍රයකම පැවැත්මට තර්ජනයක් එල්ල කරනවා. අනාගතය පිළිබඳව අවිනිශ්චිතතාවයක් නිර්මාණය කෙරෙනවා. අද තියෙන්නේ අර්බුදවලින් ගහන සමාජයක්. දරුවන් පළවෙනි පංතියට දාගන්න බැරි තත්වයට සමාජ අර්බුදයන් නිර්මාණය වෙලා. පහේ ශිෂ්‍යත්වයෙන් සමත්වුණු ළමයින්ට ඉස්කෝලයක් හොයා ගන්න බැරි තත්වයට පත්වෙලා. උසස් පෙළ විභාගයේදී ලබාගත හැකි උසස්ම සාමාර්ථය වන "ඒ 3" ගත් දරුවාට වෛද්‍ය පීඨයට යන්න බැරි සමාජ අර්බුදයක් නිර්මාණය වී තිබෙනවා.

අර්බුදය අවසානයේදි මිනිසුන්ට ජීවිතය අහිමිකරන තැනට ඇවිල්ලා. 2017දී සියදිවි හානිකර ගැනීම් 3263යි. 2018 3281යි. සියදිවි හානිකර ගැනීමට ප්‍රයත්නය දැරූ සංඛ්‍යාව 10,000ක් පමණ වෙනවා. දවසකට ආසන්න වශයෙන් 09 දෙනෙක් සියදිවි නසා ගන්නවා. යාපනය දිස්ත්‍රික්කයේ සියදිවි හානිකර ගන්නා වැඩිම ප්‍රමාණය කාන්තාවන්. හේතුව ණය ගෙවා ගන්න බැරිකම. ක්ෂුද්‍ර මූල්‍ය ණය ගන්නා අයට 150%ක පමණ පොලියක් ගෙවන්න වෙනවා. ණය ගෙවා ගන්න බැරිව සියදිවි නසා ගන්න එක පුරවැසියෙක්වත් අපේ රටේ නොසිටිය යුතුයි. තව පැත්තකින් 2019දී අවුරුදු 16ට වඩා අඩු දැරිවියන් 305 දෙනෙක් දූෂණය කරලා තිබෙනවා. අඩම්තේට්ටම්වලට ලක්වී තිබෙන ප්‍රමාණය ඊට වඩා විශාලයි. 2019දී අපේ රටේ දැරිවියන් සහ කාන්තාවන් 594ක් දූෂණයට ලක්වූ බව පොලිස් පොතේ ලියවිලා තිබෙනවා.

2019දී මිනිස් ඝාතන 479ක් සිදුවෙලා තිබෙනවා. 2020දී 464යි. ජීවත් වෙන්න මෙහෙම රටක් යෝග්‍යයිද? අවුරුදු 05ට වඩා අඩු දරුවෝ 21%ක් මන්දපෝෂණයෙන් පෙළෙනවා. 2019දී වාහන අනතුරු 30,000ක් වෙලා තිබෙනවා. මේ නිසා ආසන්න වශයෙන් දවසකට 8දෙනෙක් මිය යනවා. පිළිකාවලින් ආසන්න වශයෙන් දවසකට 14 දෙනෙක් මිය යනවා. එක් ලක්ෂ අසූදාහක් වසරකට පිළිකා රෝගීන් හඳුනා ගන්නවා. අවසානයේදී මිනිස් ජීවිත පොඩිපට්ටම් කරමින් අර්බුදය ගමන් කරනවා. මේ සිස්ටම් එකේ කිසිවක් සිස්ටම් එකට දුවන්නේ නැහැ. කෝවිඩ් එන්නත ලබාගන්න ලෝක සෞඛ්‍ය සංවිධානයෙන් සෑම රටකටම සිස්ටම් එකක් හැදුවා. ජනගහනයෙන් 70%කට එන්නත විදින්න ඕනෑ. හැබැයි කිසිදු රටකට මේ ඉලක්කයට යන්න බැහැ. මුලින්ම සෞඛ්‍ය කාර්ය මණ්ඩලවලට, ඊළඟට වයස අවුරුදු වඩා වැඩි අයට, ඊළඟට විවිධ රෝගවලින් පෙළෙන අය. නමුත් අපේ රටේ පළමු තැන මන්ත්‍රීවරුන්ට; කෝ සිස්ටම්. සමාජ ක්‍රමයක් හැටියට නොවෙයි යාන්ත්‍රණයක් හැටියටත් මේක අසමත්. මේ සමාජය අපිට උරුමකරලා දීලා තිබෙන්නේ මරණය. ජීවිතයක් නැහැ.

අද විශාල පිරිසක් මානසික පීඩනයට ගොදුරුවෙලා. මේ සමාජ ක්‍රමය ක්‍රමයක් හැටියටම අසමත්. මේ සිස්ටම් එක ෆේල්. එහෙනම් අපි අලුත් සිස්ටම් එකකට යන්න ඕනෑ. ඒ වෙනුවෙන් මුලින්ම සමාජය පරිවර්තනය වෙන්න ඕනෑ. ඊළඟට ආර්ථික පරිවර්තනයක් ඇති කරන්න ඕනෑ. ලාභ උපරිම කරගැනීම සඳහා තරගකාරිත්වයක් ඇති සමාජයක් තිබෙන්නේ. ඒ සමාජයේ තමයි 2020දී මුළු ආර්ථිකයම කඩා වැටෙනකොට සමාගම් කිහිපයක් මත ජාතික ධනය කේන්ද්‍රගත වන තිරශ්චීන ක්‍රමයක් තිබෙන්නේ. තරඟය ඔවුන්ට ලාභ උපයා ගැනීමේ මෙවලමක්. ඒ නිසා මේ සමාජය තරගකාරිත්වයකට තල්ලු කරලා තිබෙන්නේ. ඒ වෙනුවට අපි යෝජනා කරන්නේ මොකක්ද?


සමාජයට අවශ්‍ය පරිවර්තනය සහයෝගයයි. සහයෝගයෙන් යුතු සමාජයක් අවශ්‍යයි. පළවෙනි පන්තියේදී අනික් දරුවන් ගැනත් අවධානය යොමුකරමින් ඒ දරුවන් එක්කම ගොඩයන සහයෝගයක් අවශ්‍යයි. තරඟ කාරිත්වයෙන් මුසපත් කර තිබෙන සමාජය වෙනුවට සහයෝගයේ ආලෝකය විහිදුවන සමාජයක් අවශ්‍යයි. වැලි ගොඩදාන කෙනා ඉදිකිරීම් කර්මාන්තයට අවශ්‍ය වැලි සපයනවා. නමුත් ලාභය වැඩි කරගන්න වැලිගොඩ දාන කෙනා ගංගාවේ තිරසාර පැවැත්ම ගැන කල්පනා කරන්නේ නැහැ. මේ සමාජයට තරඟකාරිත්වයෙන් ඉදිරියට යන්න තවදුරටත් බැහැ. සහයෝගය නම් බදු අඩු කළාම අඩු මිලට ජනතාවට සීනි දෙනවා. තරඟකාරිත්වය නම් කෝටි 1590ක බදු සාක්කුවේ දාගන්නවා. සහයෝගිත්වය නම් පොදු ජනතාවට සහන ලබාදෙනවා. අපිට එහෙම සමාජයක් අවශ්‍ය නැද්ද? අපේ පළවැනි අධිෂ්ඨානය මේ සමාජය සහයෝගය සහිත යහපත් සමාජයක් බවට පත්කිරීමයි.

දේශපාලන පරිවර්තනය සිදුකරන්නේ කොහොමද? අද පවතින්නේ අතිශය ලාභ ලබන, වරප්‍රසාද ලබන, දේශපාලනයක්. කොවිඩ් එන්නත එනකොට ඉස්සෙල්ලාම ලබාගන්නා දේශපාලකයන්. විශාල වරප්‍රසාද, විශාල ආදායමක් ලබාගත හැකි වෘත්තියක් තමයි අද දේශපාලනය. ව්‍යාපාරයක් බවට පත්ව තිබෙන දේශපාලනය, මහජන සේවයක් බවට පත්කරන දේශපාලන පරිවර්තනයක් අවශ්‍යයි. ඒ වෙනුවෙන් මුළු සමාජයේම ආකල්පමය පරිවර්තනයක් ඕනෑ. දේශපාලනයේදී එක එක මැජික්කරුවන්ට ඒක කරන්න බැහැ. මේ සමාජයේ අද දියත් වෙමින් තිබෙන්නේ අපේ රටේ අනුගමනය කරන ලද සමාජ ආර්ථික දේශපාලනයේ මර ළතෝනියයි.

ගෝඨාභයට තිබුණේ මැද පාංතික සංවර්ධන සිහිනයක්. ග්‍රාමීය ජනතාවගේ ජීවිතය අවලස්සන වෙලා ලස්සන කොළඹක් හදන්න බැහැ. මැද පාංතික සිහින සැබෑ කරන්නත් බැහැ. සංවර්ධනයේදී නම් ජනතාවගේ ජීවන සහ සමාජීය තත්වය උසස් වෙන්න ඕනෑ. අපේ රටේ ග්‍රාමීය ජනතාවගේ ජීවිතය සහ සමාජීය තත්වය උසස් වෙන්න ඕනෑ. අපේ සංවර්ධන උපාය මාර්ගය ග්‍රාමීය ජනතාවගේ ජීවන තත්ත්වයත් සමාජීය තත්වයත් උසස් කිරීමයි.

අපේ රටේ සම්පත් යොදාගෙන වඩාත් කාර්යක්ෂමව උසස් ඵලදාවක් ලබාගත හැකි කර්මාන්ත පද්ධතියක් ඉදිකරන්න ඕනෑ. ඉල්මනයිට්, මිනිරන්, වගේ බැර කර්මාන්ත පද්ධතියක් නිර්මාණය කරන්න ඕනෑ. අපේ රටේ අමුද්‍රව්‍ය යොදා ගන්න කර්මාන්ත බවට පත්වෙන්න ඕනෑ. අපේ ශ්‍රම සම්පත, තාක්ෂණය, යොදා ගන්න ඕනෑ. හැබැයි ඒකෙන් විතරක් ගොඩඑන්න බැහැ. පිහිටීම, ස්වභාවික සම්පත්, මානව සම්පත, දියුණු කරගෙන ආර්ථික පරිවර්තනයකට යොදා ගන්න ඕනෑ. ඒ වෙනුවෙන් මානව සම්පත දියුණු කරන්න අධ්‍යාපනය, වෙනුවෙන් පළමුවත්, දෙවනුවත්, තෙවනුවත් ප්‍රමුඛත්වය දෙන්න ඕනෑ. ඒ වෙනුවෙන් හොඳ චින්තනයක් සමාජීය වශයෙන් නිර්මාණය කරන්න ඕනෑ. රට වෙනුවෙන් ජාතික ධනය උත්පාදනය කරන මානව සම්පතක් බවට පත්කරන්න ඕනෑ. ලෝකයේ දියුණුම ශ්‍රම වෙළෙඳපොළෙන් පංගුවක් අත්පත්කර ගත හැකි මානව සම්පතක් නිර්මාණය කරන්න ඕනෑ. එවැනි නව ආර්ථික උපායමාර්ගයකට අපේ රට පරිවර්තනය කරන්න ඕනෑ.

මේ විදිහට එකතු වෙන ධනය සාධාරණ ලෙස බෙදීයන ක්‍රමයක් හදන්න ඕනෑ. ඒ වෙනුවෙන් අපේ බදු ප්‍රතිපත්තිය යළි සැකසිය යුතුයි. අද වක්‍ර බදු 82%යි. සෘජු බදු 18%යි. වක්‍රබදු කියන්නේ මුළු රටේම ජනතාවට සමාන ලෙස ගහන බදු. උදාහරණයක් හැටියට ධම්මික පෙරේරා මහත්මයා කඩේට ගිහින් සිනි කිලෝ එකක් ගත්තොත් එයාටත්, ගමේ ඉන්න ගොවි මහත්තයා කඩෙන් සීනි කිලෝ එකක් ගත්තත් අයකරන සමාන බද්ද. ඒ නිසා අපේ සෘජු බදු අඩුම තරමින් 40% දක්වාත් වක්‍ර බදු 60% දක්වාත් කෙටි කාලයකදී පරිවර්තනය කරන්න ඕනෑ. ආදායම් බෙදී යාමේ විෂමතාවය අවම කරන එක යාන්ත්‍රණයක් හැටියට බදු යොදා ගන්න ඕනෑ. ඒ වගේම ආර්ථික ක්‍රියාවලියත් එක්ක අද සම්බන්ධ නැති ග්‍රාමීය ජනයා දක්වා ආර්ථිකය ප්‍රසාරණය කරන්න ඕනෑ. ආර්ථිකයේ සම පංගුකරුවන් බවට ග්‍රාමීය ජනතාව පත්කර ගැනීමෙන් ඔවුන්ගේ ආදායම් මට්ටම ඉහළ දමන්න පුළුවන්. අනික් පැත්තෙන් මේ රටේ නිෂ්පාදන ඒකාධිකාරිත්වයක් හැදෙන එක වළක්වන්න ඕනෑ. අද අපේ සහල් වෙළඳපොළ තිබෙන්නේත් ඒකාධිකාරිත්වයක. ඒ නිසා ගොවි ජනයාට සාධාරණ මිලට වී විකුණන්න බැහැ. පාරිභෝග කයාට සහන මිලට හාල් ගන්න බැහැ. රජය මැදිහත් වී ඒකාධිකාරිත්වය බිඳින්න ඕනෑ. අත්‍යාවශ්‍ය ආර්ථික ක්‍රියාකාරිත්වයන්ට රජය මැදිහත් වෙන්න ඕනෑ.



මේ සිස්ටම් එකේ මේ රටේ ජනතාව අවුරුදු 73ක් ගමන්කර තිබෙනවා. මේ ක්‍රමය අසාර්ථක බවට ඒ කාලය තුළ අපිට ඕනෑවටත් වඩා ඔප්පු කර හමාරයි. කවර හෝ ක්ෂේත්‍රයක ජයග්‍රහණ තිබෙන බව කාට හරි කියන්න පුළුවන්ද? රාජ්‍ය පරිපාලනය බිංදුවට වැටිලා. ගෝඨාභය ආර්.එම්.වී. එකට පැන්නා කියලා ඒක වෙනස් කරන්න බැහැ. ඒව සෝබන වැඩ. ඒ වෙනුවෙන් සමාජ පරිවර්තනයක් ඕනෑ. සහයෝග යෙන් සමාජ ආකල්ප පරිවර්තනය කරන අය එකතු වෙන්න ඕනෑ. මහජන සේවාවක් බවට පරිවර්තනය කරන දෙශපාලනයේ සිට සෑම ක්ෂේත්‍රයකම සහයෝග යක් බවට පත්වෙන්න ඕනෑ. මේ සිස්ටම් එක වෙනස් කර, මියැදෙන්න බලකර තිබෙන ජනතාවට ජීවිතය යළි ලබාදීමේ ආර්ථික සැලැස්මක්, ජීවිතය යහපත් කිරීමේ සමාජ සැලැස්මක් ආදර්ශමත් දේශපාලනයක් ඕනෑ. අන්න ඒ තැනට මේ සිස්ටම් එක වෙනස් කරමු. ඒක නොකරන තාක්කල් තව එක එක වර්ගයේ ලේබල් ගහපු නායකයින් එළියට දාන්න පුළුවන් වෙයි. නමුත් ප්‍රතිඵලයක් අත්පත් වන්නේ නැහැ. එවැනි සමාජ ආර්ථික දේශපාලනික පරිවර්තනයක් වෙනුවෙන් මේ මොහොතේ පෙළගැහෙන්න ඕනෑ. අපි හැමදෙනාම ඒ වෙනුවෙන් වෙනදාට වඩා වේගයෙන් ඒකරාශී වී සමාජය දැනුවත් කරන්න ආරාධනා කරනවා.

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com




කැකිල්ලේ කොමිසමට එරෙහිව අධිකරණයට...



ව්‍යාජ ෆේස්බුක් පිටුවලට එරෙහිව පොලීසියට...



විදෙස් ශ්‍රමික අයිතිය වෙනුවෙන් ජාත්‍යන්තරයට...




විදෙස් ශ්‍රමිකයින්ගේ අයිතිය ඉල්ලා.. (ඉතාලිය)



සීනි වංචාවට එරෙහිව අධිකරණයට...




බඩු මිල අඩු කරන ලෙස බලකරමින්...




# මහපොළොව රැකගැනීම වෙනුවෙන් ජනතාවට ඇත්තේ ජනතා විමුක්ති පෙරමුණ පමණයි

හැත්තෑ තුන්වසරක් ජනතාව විසින් දෙන ලද ඡන්දවලින් පරිසරය වනසමින් තිබේ නම්, එය බේරාගැනීමේ වගකීමද ඇත්තේ ජනතාවට බවත් එබැවින් දේශප්‍රේමයට පරිසර ප්‍රේමය ඇතුළත් කර ගන්නා ලෙස ඉතාම ආදරයෙන් ජනතාවගෙන් සිටින බවත් හුස්ම ගන්නා ගහ, වතුර බොන උල්පත, ජීවත්වන මහපොළොව රැකගැනීම සඳහා පෙරට එන ලෙස ජනතාවගෙන් ඉල්ලා සිටින බවත් ප්‍රකාශ කළ ජ.වි.පෙ. මධ්‍යම කාරක සභික සමන්ත විද්‍යාරත්න සහෝදරයා, ඒ වෙනුවෙන් ජනතාවට තෝරා ගැනීමට ඇත්තේ ජනතා විමුක්ති පෙරමුණ පමණක් බව අවධාරණය කළේය.

සමන්ත විද්‍යාරත්න සහෝදරයා මේ බව පැවසුවේ පසුගිය 22වැනි දින කොළඹ කොටුව දුම්රියපොළ ඉදිරිපිට පැවති විරෝධතා උද්ඝෝෂණය අමතමිනි. වැඩිදුරටත් අදහස් දැක්වූ ඔහු මෙසේද පැවසීය.

"වර්තමාන ආණ්ඩුව බලයට පත්වීමේදී පරිසරය ගැන ඉහළින්ම කතා කළා. විල්පත්තු වනය විනාශ කිරීම මේ අයගේ දේශපාලන බල හුවමාරුව සඳහා විශාල වශයෙන් පාවිච්චි කළ පරිසර ප්‍රශ්නයක්. නමුත් නන්දසේනලා බලයට ආව මොහොතේ සිටම රක්ෂිත වනාන්තර, කඩොලාන, ජල පෝෂක ප්‍රදේශ ඔක්කෝම විනාශ කරමින් ඉන්නවා. මේ මහපොළොවේ ජීවත්වෙන මිනිස්සු, මේ මහපොළොවෙන් වතුර බීපු, තුන්වේල කාපු මිනිස්සු මේ විනාශයට ඉඩ තියන්නේ නැහැ. පක්ෂයක්, පාටක්, ජාතියක්, කුලයක්, මලයක්, ආගමක් නැති මිනිස්සු මේ එරෙහිව නැගිටිනවා. වනාන්තර, ගංගා ඇළදොළ, උල්පත් රකින්න අපි කාටත් ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාවෙන්ම අයිතියක් තියෙනවා. ඒක කාටවත් කොල්ලකන්න පුළුවන්කමක් නැහැ. අද ලෝකයේ විශේෂිත දිනයක්. ලෝක ජල දිනය. එක්සත් ජාතීන්ගේ සංවිධානය 1993දී ජලයට සිදුවන විනාශයන් දැකලා මාර්තු 22 වැනිදා ලෝක ජල දිනය හැටියට ප්‍රකාශයට පත් කළා. ලංකාවේ ඒ වෙනුවෙන් තේමාව දාලා තියෙන්නේ "තිරසාර සංවර්ධනය සඳහා ජලය ආරක්ෂා කරමු" කියලා. දැන් නන්දසේන මහත්තයා මැණික් ගඟ සුරකින්න ගිහිල්ලා ඉන්නේ. ගිය සතියේත් හෙලිකොප්ටර් බාන්න කියලා කතරගම තිබුණු කුඹුක්ගස් ටික කපලා දැම්මා.

ඔබට, මට ගස්කොළන්, ඇළදොළ, සතාසීපාවා පේන විදිහට පාලකයන්ට පේන්නේ නැහැ. ඒක නන්දසේනට විතරක් නෙවෙයි ජේ.ආර්.ට පෙනුණෙත් නැහැ. වික්‍රමසිංහටයි, ප්‍රේමදාසටයි පෙනුනෙත් නැහැ. එයාලට ගස් ටික පෙනුණේ වට අඩි ගාණට. ජල මූලාශ්‍ර ටික දැක්කේ අලෙවි කරන්න පුළුවන් වස්තූන් හැටියට. මහා රූස්ස කැලේ හෝටල් ගහන්න පුළුවන් තැන් විදිහට දැක්කේ. පරිසර පද්ධතිය විනාශ කරලා තියෙන්නේ. ඊයේ ලෝක වනාන්තර දිනය. අද ලෝක ජල දිනය. නන්දසේන මහත්තයා බලයට ඇවිල්ලා අවුරුද්දයි මාස හතරක් වෙනකොට ලංකාවේ රක්ෂිත භූමි දෙසිය අනූහයකට හානිකරලා තිබෙන බව ජාතික පුවත්පත් වාර්තා කර තිබෙනවා. පරිසරවේදීන් ප්‍රකාශ කළ මේ තොරතුරුවලට පරිසර අධිකාරියෙන් යම් පිළිගැනීමක් තිබෙනවා. 2020 ජනවාරියේ ඉඳලා මේ මාර්තු වෙනකොට අක්කර 62,000ක් රක්ෂිත භූමි විනාශ කරලා. අක්කර 18,500ක් විනාශ කළේ, ගිය අවුරුද්දේ. 2021 තාම මාස තුනක් ගියේ නැහැ. මේ පුංචි කාලය තුළ අක්කර 43,500ක් විනාශ කරලා.

බිඳ වැටෙන හැම ගහක් ගහක් ගානේ, විනාශ කෙරෙන හැම රක්ෂිතයක් ගානේ, මරා දමන හැම උල්පතක් ගානේ, ඔය මරා දමන හැම සතෙක් ගානේම නන්දසේන විතරක් නොවෙයි ඒ පසුපස 69 ලක්ෂයක ඡන්ද ටිකක් තියෙනවා. මේ පාලකයෝ ජනාධිපතිකම, තුනෙන් දෙකේ බලය ඔක්කෝම අරගෙන ඉන්නේ. විස්සත් ඕනෑ කිවුවා. දැන් අධික බලයක් තිබෙන්නේ. රටේ හතර අත වනසන දේශපාලනයක නන්දසේනලා නිරත වෙමින් ඉන්නවා. මේවා ආපසු



ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම කාරක සභික


**සමන්ත විද්‍යාරත්න සහෝදරයා**

හරවන්න ඕනෑ. "කොළඹ මල් හිටෙව්වේ මං, ඇවිදින මංතීරු හැදුවේ මං, පරිසරය ලස්සන කළේ මං" කියලා මාධ්‍ය හමුවේ කියනවා. පරිසර පද්ධතියක් කියන්නේ එහෙම එකක් ද? ජෛව විවිධත්වය කියන්නේ අනාගතයේ සිංහරාජයේ මල් හදනවා වගේ එකක්ද?


අපේ රට රුපියල්, ශත අතින් දුප්පත් කරලා තිබෙන්නේ. හැබැයි තවමත් අත තියපු නැති භාණ්ඩාගාර ටිකක් තියෙනවා. සිංහරාජය, නකල්ස් කඳු පද්ධතිය ඇතුළු හයසීයකට අධික රක්ෂිත ටිකක් තිබෙනවා. ඒවා සැබෑ මහා භාණ්ඩාගාර. අපේ ජාන ගබඩාව, අපේ ආහාර ගබඩාව, ජල ගබඩාව, බලශක්ති ගබඩාව, ඖෂධ ගබඩාව එතන. රටේ සම්පත් තියන භාණ්ඩාගාරයට දැන් අත තියනවා. ගඩොල් බානවා වගේ පරිසර පද්ධතියක් හදන්න බෑ. නන්දසේන ජනාධිපති වුණාම පරිසර ඇමතිකම එස්.එම්. චන්ද්‍රසේනට දුන්නා. එයා පත්වුණු ගමන් විල්පත්තුවේ පරිවාර රක්ෂිත කලාපයේ අක්කර 1500ක් ගස් කපලා කෝමාරිකා හිටවන්න දුන්නා.

පොල්ලේබැද්දේ ආදිවාසීන් ජීවත්වන ගල්වලයාය රක්ෂිතයේ අක්කර 5426ක් කඳුත් එක්ක වටකරලා කොම්පැනියකට දුන්නා. වෙන අයගේ නම් දාලා ඉඩම් අරන් තියෙන්නෙ ඇමතිලා. කැලේ හිටපු අලි ටික පොල්ලේබැද්දේ ගමට වැදිලා ඉන්නවා.

මේ විනාශය බලාගෙන ඉන්න බැරි මිනිස්සු පිරිසක් ඉන්නවා. ඒ තමයි මේ රැස්වෙලා ඉන්න මිනිස්සු කියලා අපි නන්දසේනට මතක් කරන්න කැමතියි. මහින්ද රාජපක්ෂ මහත්තයා බලය ගන්න පොළොවට වැන්දා. මාතෘ භූමිය රකිනවා කිවුවා. දැන් මොකද වෙන්නේ. කෑලි කරනවා, කොම්පැනිවලට දෙනවා. වහාම රක්ෂිතවලට දාපු ඩෝසර්, කැලේට දාපු ඩෝසර් ආපසු ගේන්න ඕනෑ කියලා අවධාරණය කරනවා. එහෙම නොකළොත් අපේ ඩෝසරය ස්ටාට් කරලා ආණ්ඩුව ඩෝසර් කරලා දාන බව නන්දසේන, මහින්ද රාජපක්ෂට ඇතුළු කණ්ඩායමටම කියන්න කැමතියි.


ආධාරය රු.100.00




ආධාරය රු.100.00



බත්තරමුල්ල, පැලවත්ත, පන්නිපිටිය පාරේ 464/20 හි පදිංචි එම්.ටිල්වින් සිල්වා වන මා විසින් අංක 43/20, නුගගහ පෙදෙස, පිළියන්දල පාර, මහරගම පිහිටි නියමුවා ප්‍රකාශන ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.